# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,864 — 1969 ජූලි 25 වැනි සිකුරාදා — 1969.7.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 1255 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1278 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1278 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1301 | විවිධ දැන්වීම ... ... | — |



## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

1255——බී 69389—15,721 (69/7)

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්ව යක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**— මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔවුනු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දෑතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරනලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීනු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටීත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණුම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලබීමටත්, තෝරා ගැනී මෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒඒ 58/එක්ස් 2117/69

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### ඉලෙක්ට්‍රෝනික්ස් සහ විදුලි සන්දේශ පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ඉලෙක්ට්‍රෝනික්ස් සහ විදුලි සන්දේශ පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා හෝ ඊට පුහුණුවන්නකු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 8 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 15 වැනි ද.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරී යෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුයි.

((ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශ යෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම් කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවර යෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

වාර්ෂිකව : රුපියල් 4,080—360—රු. 8,400.

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්.එස්.සී. හෝ පී.එච්.ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තා වූ අය, වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හෝ එවැනි උසස් තත්ත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3ක ඉගැන්වීමේ පළපුරුද්ද ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ.

(iii) ඒ.එම්.අයි.සී.ඊ., ඒ.එම්.අයි.ඊ.ඊ. හෝ ඒ.එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත් නම්, ඔවුනට ද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමිවේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔව්හු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 අගෝස්තු 8 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉලෙක්ට්‍රෝනික්ස් සහ විදුලි සන්දේශ විෂයයන් සහිතව විදුලි ඉංජිනේරු උපාධියක් හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම. (ගුවන් විදුලි සන්දේශ පිළිබඳ පළපුරුද්දක් ඇති අයට වැඩි සැළකිලි දක්වනු ලැබේ.)

හෝ

(ආ) ඒ.එම්.අයි.ඊ.ඊ. I වැනි, II වැනි හා III වැනි කොටස් සමග ගුවන් විදුලි සන්දේශ වෘත්තීය පිළිබඳ තුන් අවුරුදු පළපුරුද්ද.

හෝ

(ඇ) විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ එච්.එන්.සී. සහතිකය සමග ගුවන් විදුලි සන්දේශ වෘත්තීය පිළිබඳ තුන් අවුරුදු පළපුරුද්ද.

සහ

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීනත්වයක් ලබා ගැනීම.

5. (i) **පුහුණුව සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි.**—4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අය කිසිවකුගෙන් ඉල්ලුම්පත්‍ර නොලැබුණහොත් හෝ තනතුර සඳහා සුදුසු අයදුම්කරුවකු නොසිටියහොත් පුහුණුවන්නකු පත්කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට භාජනය කරනු ලැබේ :—

(අ) වයස් සීමාවන් 1969 අගෝස්තු 8 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම්කරුවන්ට එකසේ බලපායි.)

(ආ) භෞතික විද්‍යාව පිළිබඳ විශෙෂ උපාධියකින් හෝ භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය හා ව්‍යවහාර ගණිතය ඇතුළත් සාමාන්‍ය උපාධියකින් හෝ I වැනි හෝ II වැනි පෙළ ගෞරව සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුල සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතුයයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමග ගිවිසුමකට බැඳිය යුතුවන්නේ ය. එම ගිවිසුම යටතේ පොරොන්දුවිය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලටද බැඳීය යුතුවේ. එනම්,

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවන්තව හදාරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු, නියමිත කාල පරිච්ඡේදයක් තුල ලංකාණ්ඩුවේ සේවය කළයුතු යයි කියා සිටියහොත් (කාලපරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමටද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මුළු කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම්, වැටුප් දීමනා, යාන ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමටද සිදුවෙයි.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයා, ඉලෙක්ට්‍රෝනික්ස් සහ විදුලි සංදේශ විෂයයන් වශයෙන් ඇතිව, විදුලි ඉංජිනේරු උපාධියක් ලබා ගත යුතුයි.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපෙක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තමතමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කල හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමතමන්ට නිකුත්කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුනු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුනු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනි දින,
කොළඹ-1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. 500.

7–1146/1—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ 42/එක්ස් 2118/69

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මහරගම රජයේ ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ මහරගම රජයේ ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඊට පෙර තැ. පෙ. 500, කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට අයදුම් පත් : 1969 අගෝස්තු 8 වැනි දින

(බී) පිටරට අයදුම් පත් : 1969 අගෝස්තු 15 වැනි දින

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත් පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතා පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නො ගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ පිළිබඳ ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කිරීම පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(ඒ) මෙම තනතුරු ස්ථිර වන අතර පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත ගුරු තනතුරු දරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් ඔවුන් විසින් ඒ තනතුරු දරන තාක් කල් විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(බී) මේ තනතුරු සඳහා මහරගම ගුරු විද්‍යාලයේ පුරප්පාඩු තිබේ. එසේ වුවද තෝරා ගනු ලබන එක් අපේක්ෂකයෙක් කෘෂිකර්ම අභ්‍යාස පාඨමාලාව හදාරන ශිෂ්‍යයන්ට අධ්‍යාපනය හා මනෝ විද්‍යාව පිළිබඳ දේශන පැවැත්වීම සඳහා හාඩි කාර්මික අභ්‍යාස ආයතනයට පත් කිරීමට ඉඩ තිබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුර සඳහා රු. 5,160—9×360—රු. 8,400 වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔ/ඈ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සනීපයෙන් යුක්ත වීම.

(බී) 1969.8.8 වැනි දිනට වයස අවුරුදු 28 ට නොඅඩු බව හා අවුරුදු 50 ට නොවැඩි බව (රජයේ සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක යටත් පිරිසෙයින් එක් අධ්‍යයන වර්ෂයක් තුළ ශික්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි හෝ එසේ නොවන, පූර්ණකාල අභ්‍යාසයක් ලබා ඇති උපාධිධරයෙක් විය යුතුය. උපාධිය ලැබීමෙන් පසු අඩුම වශයෙන් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් සහ ඉල්ලුම් කරන තනතුරුවලට අදාල වන විෂය හෝ විෂයයන් පිළිබඳ පහත දක්වෙන පරිදි උසස් සුදුසුකම් ලබා තිබිය යුතුයි :—

(1) අධ්‍යාපන හා මනෝවිද්‍යාව—පුහුණු වූ උපාධිධාරීන් විය යුතුය.

(2) ගණිතය—ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා භෞතික විද්‍යාව සහිතව උපාධියක් ලබා තිබිය යුතුය.

(3) වාණිජ විද්‍යාව—වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුයි.

(4) ඉංග්‍රීසි—ඉංග්‍රීසි විෂයයක් ලෙස ඇතිව උපාධියක් ලබා තිබිය යුතුය.

(ඩී) සිංහල පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකපත්‍ර.

(ඊ) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය :**

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍රභාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැන ගන්නට ලබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑව්ය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග ඔවුන් වෙත නිකුත් කරන ලද "ඒ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල්පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය පිළිනොපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලබන ඉල්ලුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් ඉල්ලුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 දා,
කොළඹ 1, ගාලු මුවදොර,
මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

7–1146/2—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ 43/එක්ස් 2119/69

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### පලාලි රජයේ ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පලාලි රජයේ ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඊට පෙර තැ. පෙ. 500, කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට අයදුම් පත් : 1969 අගෝස්තු 8 වැනි දින

(බී) පිටරට අයදුම් පත් : 1969 අගෝස්තු 15 වැනි දින

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත් ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතා පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නො ගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ පිළිබඳ ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කිරීම පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(ඒ) මෙම තනතුරු ස්ථිර වන අතර පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත ගුරු තනතුරක දරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් ඔවුන් විසින් ඒ තනතුරු දරන තාක් කල් විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(බී) මේ තනතුරු සඳහා පලාලි ගුරු විද්‍යාලයේ පුරප්පාඩු තිබේ. තෝරා ගන්නා ලද අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයකට පත් කිරීමට ඉඩ තිබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුර සඳහා රු. 5,160—9×360—රු. 8,400 වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සනීපයෙන් යුක්ත වීම.

(බී) 1969.8.8. වැනි දිනට වයස අවුරුදු 28 ට නොඅඩු බවට හා අවුරුදු 50 ට නොවැඩි බව (රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක යටත් පිරිසෙයින් එක් අධ්‍යයන වර්ෂයක් තුළ ශික්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි හෝ එසේ නොවන, පූර්ණකාල අභ්‍යාසයක් ලබා ඇති උපාධිධරයෙක් විය යුතුය. උපාධිය ලැබීමෙන් පසු අඩුම වශයෙන් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් සහ ඉල්ලුම් කරන තනතුරුවලට අදාල වන විෂය හෝ විෂයයන් පිළිබඳ පහත දක්වෙන පරිදි උසස් සුදුසුකම් ලබා තිබිය යුතුයි.

(1) වාණිජ විද්‍යාව—වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුය.

(2) විද්‍යාව—රසායන විද්‍යාව හා සත්ත්ව විද්‍යාව සහිතව විද්‍යා උපාධියක් ලබා තිබිය යුතුය.

(3) ගණිතය—ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා භෞතික විද්‍යා සහිතව උපාධියක් ලබා තිබිය යුතුය.

(4) ඉංග්‍රීසි—ඉංග්‍රීසි විෂයයක් ලෙස ඇතිව උපාධිය ලබා තිබිය යුතුය.

(5) අධ්‍යාපනය හා මනෝවිද්‍යාව—පුහුණුවූ උපාධිධරයකු විය යුතුය.

(ඩී) දෙමළ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකපත්‍ර.

(ඊ) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය :**

(i) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඈමිණිය යුතුයි.

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද "බී" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ පිළිබඳ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන් වෙත නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල්පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය පිළිනොපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජුලි මස 18 ද,
කොළඹ 1, ගාලු මුවදොර,
මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

4–1146/3—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංකය ඒ් 62/එක්ස් 2120/69

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### කර්මාන්තශාලා ඉංජිනේරු II වැනි ශ්‍රේණියේ තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ කර්මාන්තශාලා ඉංජිනේරු II වැනි ශ්‍රේණියේ තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්‍යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 8 වැනි දා.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 15 වැනි දා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙනා පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්‍යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්‍යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු :** ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

වාර්ෂිකව, රුපියල් 4,080—360—8,400.

**සටහන :—**

(i) පිළිගත් විශ්ව විද්‍යලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්.එස්.සී. හෝ පී.එච්.ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය, වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලයයේ හෝ එවැනි උසස් තත්ත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්ද ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ.

(iii) එම්.අයි.සී.ඊ., එම්.අයි.ඊ.ඊ., හෝ එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත් නම්, ඔවුනට ද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමිවේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුහු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 අගෝස්තු 8 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) යාන්ත්‍රික ඉංජිනේරු විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම ; හෝ

(ii) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ "ඒ" සහ "බී" කොටස් වලින් සාමාර්ථය ලබා තිබීම සහ කර්මාන්තශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් ලබා තිබීම ; හෝ

(iii) පිළිගත් කාර්මික ආයතනයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යා පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ඇතුළුව කර්මාන්තශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් ලබා තිබීම, සහ

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුලත දී සිංහල භාෂාවේ ප්‍රවීනත්වයක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොෘ ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. :

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුන දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

7–1146/4—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ ඒ 65/එක්ස් 2121/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### I වැනි ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරු කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු තෝරා ගැනීම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, "හාඩි" ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ I වැනි ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරු කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 8 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 15 වැනි දා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ මප්‍රාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඝිලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයා ගේ කායඝිලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

වාර්ෂිකව, රු. 8,880—480—13,200 (රු. 11,280 ක වැටුපෙහි අවුරුදු දෙකක නැවතීමක් හා රු. 11,760 වාර්ෂික වැටුපට පලමු කාර්යක්ෂමතා කඩඉමක්).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969.8.8 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නෙ වැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද සිවිල් ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිත I වැනි පෙළ හෝ II වැනි පෙළ ගෞරව ශාස්ත්‍රවේදී (ඉංජිනේරු) උපාධියක් (බී.ඇස්. සී.—ඉංජිනේරු)

සහ

(ii) ඒ.එම්.අයි.සී.ඊ. හෝ එම්.එස්,සී, හෝ පී,එච්,ඩී, සිවිල් ඉංජිනේරු උපාධිය.

සහ

(iii) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

සහ

(ඊ) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. (i) **පුහුණු සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි.**—4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති කිසිවෙකුගෙන් ඉල්ලුම් පත්‍ර නො ලැබුණහොත් හෝ තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු නොසිටියහොත් පුහුණුවන්නකු පත් කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජනය කරනු ලැබේ :—

(අ) වයස් සීමාවන් 1969.8.8 දිනට වයස අවුරුදු 28ට නො අඩු අවුරුදු 40ට නො වැඩි විය යුතුය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම්කරුවන්ට එකසේ බලපායි.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාවෙන් I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධියක්

සහ

(ඇ) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

(ඈ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුළ සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතු යයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමග ගිවිසුමකට බැඳිය යුතු වන්නේ ය. එම ගිවිසුම යටතේ පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලට ද බැඳිය යුතුවේ. එනම්,

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවන්තව හදාරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතු යයි කියා සිටියහොත් (කාල පරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමට ද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මූළු කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම්, වැටුප් දීමනා, යාන ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද සිදුවෙයි.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයා සිවිල් ඉංජිනේරු විද්‍යා සම්බන්ධ පිළිගත් වෘත්තීය සුදුසුකම් හෝ සිවිල් ඉංජිනේරු විද්‍යා සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබාගත යුතුය.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතු ය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්‍ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්‍ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමඟ භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) (මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඞී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

7–1146/6—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී 56/එක්ස් 2123/69.

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර

නීති කෙටුම්පත් සම්පාදක දෙපාතර්මේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතු ය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1969 අගෝස්තු මස 8 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1969 අගෝස්තු මස 15 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්‍ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්‍ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(ඒ) තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අපේක්‍ෂකයා විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(බී) තෝරා ගනු ලබන අපේක්‍ෂකයා තුන් අවුරුදු ආධුනික කාලයක් මත පත්කරනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය : වර්‍ෂයකට රු. 8,880 න් පටන් ගෙන රු. 480 බැගින්වූ වැඩිවීම් 9 ක් සහ රු. 600 බැගින්වූ වාර්ෂික වැඩිවීම් 2ක් මගින් රු. 14,400 තෙක් වැඩිවේ. (රු. 11,280 හිදී දෙවර්ෂයක නැවතීමක් සහ රු. 11,760 ට පෙර කාර්යක්‍ෂමතා කඩඉමක් ද ඇත.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) අවුරුදු පහකට අඩු නොවන කාලයක් වෘත්තියෙහි යෙදී සිටි අධිනීතිඥවරයෙකු බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්‍ෂකයෙකුම සූදානම් විය යුතු ය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්‍ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු : (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්‍ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝමර්ය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) (මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

7–1146/7—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී/68/එක්ස් 2124/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### (ප්‍රාරම්භක ශ්‍රේණියේ) වෛද්‍ය නිලධාරී තනතුරු

ප්‍රතිශෝධිත ව්‍යවස්ථාපිත අණපනත්හි 105 වන අධිකාරය වූ, වෛද්‍ය ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ ලේඛනාරූඪ වූ වෛද්‍යවරුන්ගෙන් ද, 1970. 9. 30 වනදා හෝ ඊට පෙර හෝ සීමාවාසික සමය නිම කරන්නාවූ වෛද්‍ය උපාධිධරයින්ගෙන් ද සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ප්‍රාරම්භක ශ්‍රේණියේ) වෛද්‍ය නිලධාරී තනතුරු 145 ක් පමණ උදෙසා අයැදුම් පත් කැඳවනු ලැබේ. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල කළ යුතු අයැදුම් පත්, 1969. 8. 8 වනදා හෝ ඊට පෙර හෝ ලැබෙන සේ කොළඹ 1. තැ. පෙ. අංක 500 හිමි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුයි.

**සැලකිය.—**

(අ) 1970. 9. 30 වනදා හෝ ඊට කලින් හෝ ලංකාවේ රජයේ රෝහල්හි සීමාවාසික සමය නිම කරන්නාවූ වෛද්‍ය උපාධිධරයින් කෙරෙහි වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

(ආ) අයැදුම් පතක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් හෝ තැපැලේදී නැතිවූ බවට නොහොත් ප්‍රමාදවූ බවට ගෙනෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අන්තිම දිනය තෙක් තම අයැදුම් පත් ප්‍රමාද කර ගන්නා අයැදුම්කරුවන් එසේ කළ යුත්තේ එයින් සිදුවන පාඩුව විඳ ගැනීමට සූදානමින් ය.

**2. සේවයේ නියුක්ත කරවන වගන්ති සහ සේවා තතු.—**

(අ) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට හිමිකම් නොමැත.

(ඉ) පත්වීම් දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—තනතුරකට අයත් වැටුප් ක්‍රමය මෙසේ වෙයි :—

ප්‍රාරම්භක ශ්‍රේණිය : වසරකට රු. 5,880—360—රු. 6,240 ;

II වන ශ්‍රේණිය : වසරකට රු. 6,960—4×360—6×480—රු. 11,280 (රු. 11,280 දී ඇවුරුද්දක විරාමයකි.) ;

I වන ශ්‍රේණිය—වසරකට රු. 11,760—3×480—රු. 13,200.

4. මතු සඳහන් ලියකියවිලි සියල්ල හෝ, ඉන් කිසිවක් හෝ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි කල්හි අපේක්ෂක/අපේක්ෂිකාවන් ඒවා එපරිදි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අපේක්ෂකයා ලක් වැසියෙකු බවත්, උපන් දිනයත් ඔප්පු කිරීම පිණිස උප්පැන්න සහතිකය (සැ. යු.—උපකෘත පාසල්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන ලුහුඬු උප්පැන්න සහතිකයවත් බව්තීස්ම සහතිකයවත් මේ සඳහා පිළිගනු නොලැබේ.)

(ආ) ලැබූ උසස්ම අධ්‍යාපන සහතිකය නොහොත් උපාධිය ;

(ඉ) වෘත්තීය සහ/නොහොත් ශිල්පීය සුදුසුකම් දැක්වෙන සහතිකය ;

(ඊ) සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් සමත්වූ ඉහළ ම විභාගය දැක්වෙන සහතිකය.

**සැලකිය :—**

(i) ලියකියවිලි හෝ ලියකියවිලි පිටපත් හෝ කිසිවක් අයැදුම් පතට නො ඇමිණිය යුතු යි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලූ කල ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයැදුම්කරුවන්ගේ අයැදුම් පත් සලකා බලනු නො ලැබේ.

5. අයැදුම්පත් ද, ඒ හා සම්බන්ධිත වෙන යම් ලියුම්කියුම් කිසිවක් වෙතොත් ඒවා ද එවිය යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට ලිපිනය ලියා මිසැ, මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුට නමින් අමතා නොවේ.

6. රාජ්‍ය සේවයේ තනතුරුවලට දෙන පත්වීම් කෙරෙහි බලපාන්නා වූද, මේ ගැසට් පත්‍රයේ I කොටසේ (II) වන ඡේදයේ පටන් ගැන්මේදී පළවී තිබෙන්නා වූද පොදු කොන්දේසි ද කියවා බලනු යෙහෙකි.

7. අයැදුම් පත් ලැබුණු බව ඒ එවූ සියල්ලන්ට දන්වා එවනු ඇත. අයැදුම් පත් පියවනදා සිට දෙසතියක් ඇතුළත යම්කිසි අයැදුම්කරුවෙකුට සිය අයැදුම් පත ලැබුණු බවට ලිපියක් නොලැබුණොත් ඔහු/ඇය විසින් ඒ බව එවිගසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතු යි. මේ නියමය ඉටු කිරීමට අපොහොසත් වවුහොත් තම අයැදුම් පත සලකා බලන ලෙස ඉල්ලීමේ අයිතිය අයදුම්කරුට නොලැබී යයි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනිදා,
කොළඹ, තැ. පෙ. අංක 500 හිමි
මහලේකම් ප්‍රායේ පිහිටි,
රා. සේ. කො. සභා කාර්යාලයේ දී ය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෛද්‍ය නිලධාරී තනතුර සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම :————

2. ස්ත්‍රීපුරුෂ භාවය :————.

3. ජාතිය (රට වැසිකම ලැබුයේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග දක්වන්න) :————.

4. කාර්යාලයීය ලිපිනය :————, පෞද්ගලික ලිපිනය :————.

5. උපන් දිනය :————.

6. විවාහකද, තනිකඩද යන වග :————.

7. ඔබේ විශ්ව විද්‍යාලීය සමයට අයත් මතු සඳහන් තොරතුරු සපයන්න :—

(අ) විශ්ව විද්‍යාලයේ නම :————.

(ආ) ඊට බැඳුණ දිනය :————.

(ඉ) අස්වූ දිනය :————.

(ඊ) සමත්වූ විභාග දින සමග (අවසාන පරීක්ෂණයේදී ඔබ පන්තියකින් සමත්විද යන බව සඳහන් කරන්න) : ————.

(උ) සීමාවාසික සමය නිමවන දිනය සහ රෝහලේ නම : ————.

මවිසින් ඉහත දක්වන්නට යෙදුණු තොරතුරු සැබෑ බවත්, නිවැරැදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1146/8—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ. 53/එක්ස්. 2125/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ අධ්‍යාපන අධ්‍යක්‍ෂ (කණිෂ්ඨ විශ්ව විද්‍යාල ආයතන) තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ II ශ්‍රේණියේ අධ්‍යාපන අධ්‍යක්‍ෂ (කණිෂ්ඨ විශ්ව විද්‍යාල ආයතන) තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු 8 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු 15 වැනි දා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්තිය හා කොන්දේසි.**—මෙම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ස්ත්‍රියක් මෙම තනතුරට පත් කරන ලද නම් ඇයට අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභයක් හිමිවන අතර ඇය විසින් ස්වකීය වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුයි.

තෝරා ගනු ලබන අයදුම්කරුවෝ දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි යෙදී නොසිටිත් නම් අවස්ථාවෝචිත පරිදි අවුරුදු තුනක් ආධුනික හෝ පරීක්ෂා කාලයකට යටත්ව පත් කරනු ලබනවා ඇත.

අවුරුදු 10 ක් සේවය සම්පූර්ණ කිරීමට මත්තෙන්, අර්ථ සාධක අරමුදලට තවදුරටත් දායකවීමේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීමේ හෝ තීරණය සිය මනාපය පරිදි ගැහැණු නිලධාරියෙකු විසින් කළ යුතුය.

3. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය : නව ප්‍රවේශකයන් සඳහා රු. 11,760 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 3කින් හා රු. 600 වාර්ෂික වැටුප් වැඩිවීම් 2කින් යුක්තව රු. 14,400 දක්වා ද නව ප්‍රවේශක නො වන්නන් සඳහා පවුම් 840 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන පවුම් 30ක වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් ද පවුම් 40ක වාර්ෂික වැටුප් වැඩිවීම් 2කින් ද යුක්තව පවුම් 1,040 දක්වා ද වැටුපක් හිමි ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ සනීපයෙන් යුක්ත බව,

(ආ) 1969 අගෝස්තු මස 8 දිනට වයස අවුරුදු 35 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(ඉ) ජ්‍යෙෂ්ඨ/අ.පො.ස. විභාගයේ දී හෝ වෙනත් උසස් විභාගයකදී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමර්ථ වී සිටිය යුතුයි.

(ඊ) (i) ප්‍රධාන අධ්‍යාපන නිලධාරියෙකු වශයෙන් අවුරුදු 3කට නො අඩු සේවයක් හෝ අධ්‍යාපන උපදේශකවරයෙකු වශයෙන් අවුරුදු 5 කට නො අඩු සේවයක් ඇත්තෙකු, හෝ

(ii) රු. 9,840කට නො අඩු වාර්ෂික වැටුපක් ලබන්නාවූ උපරිම වාර්ෂික වැටුප රු. 13,200කට නො අඩු වැටුප් ක්‍රමයක් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවක හෝ විශ්ව විද්‍යාල වැනි ආයතනයක තනතුරක් දරන්නෙක් විය යුතුයි.

(උ) නිදහස් නොකරන ලද්දෙක් නම් අධ්‍යාපන නීති හා රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත් වී සිටිය යුතුයි.

**සංලක්ෂ්‍ය :** පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

(අ) අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම,

(ආ) කණිෂ්ඨ විශ්ව විද්‍යාල ආයතන ක්‍රම පිළිබඳ මනා ක්‍රියාකාරී දැනුමක් සහ පළපුරුද්දක් තිබීම,

(ඉ) අධ්‍යාපන සංවර්ධන කටයුතුවල උද්යෝගීමත්ව සහභාගිවී තිබීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය භාර ගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවුවේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දි හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. යදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුනු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම් සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 18 වැනිදා,
කොළඹ 1, ගාලු මුවදොර,
මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

7–1146/9—69.7.25. දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපනික හා සංස්කෘතික අමාත්‍යාංශය

### ලංකා කාර්මික විද්‍යාලය—බාහිර කථිකාචාර්ය තනතුරු

කොළඹ ලංකා කාර්මික විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් පාඨමාලා සහ විෂයයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් වුවමනා කර තිබේ :—

#### ගණකාධිකරණ අංශය

| පාඨමාලාව | දිවා/සන්ධ්‍යා | විෂයය |
|---|---|---|
| ගණකාධිකරණය ඩිප්ලෝමා ... | සන්ධ්‍යා ... | (1) සාමාන්‍ය වාණිජ දැනීම<br>(2) වාණිජ නීතිය<br>(3) ගණකාධිකරණය<br>(4) ගණන් පරීක්ෂණය<br>(5) පිරිවැය ක්‍රම<br>(6) උසස් ගණකාධිකරණය<br>(7) උරුමක්කාරයන් ආදියට සම්බන්ධ නීතිය<br>(8) හවුල් හා සමාගම් නීතිය<br>(9) පාලන ගණකාධිකරණය<br>(10) බදු ක්‍රම<br>(11) සාමාන්‍ය මූල්‍ය දැනීම |
| ලේකම් ශාස්ත්‍රය ... | දිවා ... | (1) ඉංග්‍රීසි භාෂාව |
| ලේකම් ශාස්ත්‍රය ... | සන්ධ්‍යා ... | (1) ඉංග්‍රීසි භාෂාව<br>(2) ගණකාධිකරණය<br>(3) නීතිය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම<br>(4) අර්ථ ශාස්ත්‍රය<br>(5) වාණිජ නීතිය<br>(6) ලේකම් පරිපාලන පරිචය<br>(7) සමාගම් ලේකම් ක්‍රම පරිචය<br>(8) රාජ්‍ය පරිපාලනය |
| බැංකු ක්‍රම ... | සන්ධ්‍යා ... | (1) පොත් තැබීම<br>(2) ආර්ථික භූගෝලය<br>(3) නීතිය පිළිබඳ මූලධර්ම<br>(4) ඉංග්‍රීසි භාෂාව<br>(5) ගණකාධිකරණය<br>(6) මුදල් න්‍යාය<br>(7) බැංකු කටයුතු සම්බන්ධ නීතිය<br>(8) විදේශීය වෙළඳාම පිළිබඳ මුදල් හුවමාරුව<br>(9) බැංකු පුහුණුව |
| ප්‍රවාහනය ... | සන්ධ්‍යා ... | (1) ප්‍රවාහන මූලධර්ම<br>(2) නවීන ප්‍රවාහන ක්‍රමයේ පරිණාමය<br>(3) ඉංග්‍රීසි භාෂාව<br>(4) අර්ථ ශාස්ත්‍රය<br>(5) නීතිය පිළිබඳ මූලධර්ම<br>(6) භූගෝල විද්‍යාව |
| පිරිවැය ගණකාධිකරණය | සන්ධ්‍යා ... | (1) කර්මාන්ත පරිපාලනය<br>(2) පොත් තැබීම<br>(3) සංඛ්‍යා ලේඛන ක්‍රම<br>(4) අර්ථ ශාස්ත්‍රය<br>(5) පිරිවැය ගණකාධිකරණය (ශ්‍රමය)<br>(6) පිරිවැය ගණකාධිකරණය (ද්‍රව්‍ය)<br>(7) පිරිවැය ගණකාධිකරණ (පොදුකාර්ය පිරිවැය)<br>(8) මූල්‍ය ගණකාධිකරණය<br>(9) කාර්මික හා වාණිජ නීතිය<br>(10) කාර්යාල පාලනය |

#### වාණිජ ඉංග්‍රීසි අංශය

| පාඨමාලාව | දිවා/සන්ධ්‍යා | විෂයය |
|---|---|---|
| වාණිජ ඩිප්ලෝමා ... | දිවා ... | (1) නීතිය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම<br>(2) ආණ්ඩු ක්‍රම<br>(3) ආර්ථික විද්‍යා මූලධර්ම<br>(4) ව්‍යවහාරික අර්ථ ශාස්ත්‍රය<br>(5) පිරිවැය ගණකාධිකරණය<br>(6) දේශපාලන න්‍යාය ධර්ම<br>(7) රජයේ මුදල්<br>(8) ගණකාධිකරණය<br>(9) ගණන් පරීක්ෂණය<br>(10) බදු ක්‍රම<br>(11) වාණිජ නීතිය |
| තක්සේරු ඩිප්ලෝමා ... | දිවා/සන්ධ්‍යා ... | (1) තක්සේරු කිරීම<br>(2) ප්‍රාදේශීය පාලන මුදල්<br>(3) නගර නිර්මාණ ශිල්පය<br>(4) කෘෂිකර්මය<br>(5) ඉඩම් පිළිබඳ නීතිය<br>(6) පළාත් පාලන නීතිය<br>(7) ගොඩනැගිලි තැනීම<br>(8) මිනුම් |
| පොත් තබන්නන්ගේ වාණිජ සහතිකය | දිවා ... | (1) වාණිජ භූගෝලය<br>(2) ඉංග්‍රීසි භාෂාව<br>(3) වාණිජ අංක ගණිතය |
| පොත් තබන්නන්ගේ වාණිජ සහතිකය | සන්ධ්‍යා ... | (1) පොත් තැබීම<br>(2) වාණිජ විද්‍යා මූලධර්ම<br>(3) ඉංග්‍රීසි භාෂාව<br>(4) වාණිජ භූගෝලය<br>(5) වාණිජ්‍ය හා මුදල් |
| උසස් ලඝුලේඛනය ... | සන්ධ්‍යා ... | (1) ලඝුලේඛනය<br>(2) ඉංග්‍රීසි භාෂාව |
| විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය | පෙර පෝදින ... | (1) විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය |

#### වාණිජ සිංහල අංශය

| පාඨමාලාව | දිවා/සන්ධ්‍යා | විෂයය |
|---|---|---|
| වාණිජ ඩිප්ලෝමා ... | දිවා ... | (1) ආර්ථික මූලධර්ම<br>(2) ආර්ථික භූගෝලය<br>(3) ගණකාධිකරණය<br>(4) ආර්ථික ඉතිහාසය<br>(5) පිරිවැය ගණකාධිකරණය<br>(6) බදුක්‍රම<br>(7) ව්‍යාපාර පරිපාලනය<br>(8) රජයේ මුදල්<br>(9) වාණිජ නීතිය |
| පොත් තබන්නන්ගේ හා ලඝුලේඛක වාණිජ සහතිකය | දිවා ... | (1) ලඝුලේඛනය<br>(2) සිංහල භාෂාව<br>(3) වාණිජ අංක ගණිතය |
| පොත් තබන්නන්ගේ වාණිජ සහතිකය | සන්ධ්‍යා | (1) පොත් තැබීම<br>(2) ගණකාධිකරණය<br>(3) වාණිජ භූගෝලය<br>(4) වාණිජ අංක ගණිතය<br>(5) ලඝුලේඛනය<br>(6) වාණිජ්‍ය සහ මුදල් |
| ලඝුලේඛක සහතිකය | දිවා/සන්ධ්‍යා ... | (1) සිංහල භාෂාව |
| උසස් ලඝුලේඛක සහතිකය ... | සන්ධ්‍යා ... | (1) ලඝු ලේඛනය<br>(2) සිංහල භාෂාව<br>(3) යතුරු ලියනය |
| විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය | පෙර පෝදින ... | (1) විකුණුම් ශාස්ත්‍රය හා, විකුණුම් පාලනය |

#### වෘත්තීය අංශය

| පාඨමාලාව | දිවා/සන්ධ්‍යා | විෂයය |
|---|---|---|
| යන්ත්‍රහල් පරිචය (තුන් අවුරුදු) ... | සන්ධ්‍යා ... | (1) යන්ත්‍රහල් පරිචය ප්‍රායෝගික<br>(2) න්‍යාය සහ ගණනය<br>(3) කාර්මික චිත්‍ර ඇඳීම |
| හේත්තු වැද්දීම (තුන් අවුරුදු) ... | සන්ධ්‍යා ... | (1) හේත්තු වැද්දීම ප්‍රායෝගික<br>(2) න්‍යාය සහ ගණනය<br>(3) කාර්මික චිත්‍ර ඇඳීම |
| වර්ණ යෝජනය (තුන් අවුරුදු) ...<br>පොත් බැඳීම ...<br>ලෙටර් ප්‍රෙස් මැෂින් මුද්‍රණය | සන්ධ්‍යා<br>සන්ධ්‍යා<br>සන්ධ්‍යා | (1) න්‍යාය සහ ගණනය<br>(2) ප්‍රායෝගික<br>(3) සිංහල භාෂාව<br>(4) ඉංග්‍රීසි භාෂාව |

| පාඨමාලාව | දිවා/සන්ධ්‍යා | විෂයය |
|---|---|---|
| ඉලෙක්ට්‍රොනික්ස් සහ රේඩියෝ සේවා කිරීම පිළිබඳ දෑවුරුදු පාඨමාලාව | දිවා ... | (1) ගුවන් විදුලි න්‍යාය<br>(2) ගුවන් විදුලි ප්‍රායෝගික<br>(3) ඉලෙක්ට්‍රොනික්ස් න්‍යාය |
| විදුලි කම්බි සවි කිරීම පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව | සන්ධ්‍යා ... | (1) විදුලි කම්බි සවිකිරීම ප්‍රායෝගික |
| ජලනල සවිකිරීම (එක් අවුරුදු) | සන්ධ්‍යා | (1) ජලනල සවිකිරීම |

කාල.—දිවාකාල පන්ති සතියේ දිනවල පෙ. ව. 8 සිට ප. ව. 5 දක්වා වෙන අතර සන්ධ්‍යා කාල පන්ති සතියේ දිනවල ප.ව. 5 සිට 7.15 දක්වා ද පෙර පෝය දිනවල ප.ව. 1.30 සිට 4.30 දක්වා ද පැවැත් වේ.

**ගාස්තු.**—බාහිර කථිකාචාර්යවරුන්ට කෙරෙන ගෙවීම් පැයකට රු.2.50 සිට රු. 21 දක්වා වෙයි. තෝරාගත් අයදුම්කරුවන්ට භාණ්ඩාගාරයෙන් අනුමත කරන පාඨමාලා තත්ත්වය අනුවත්, ඔවුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අනුවත් ගෙවීම් කරනු ලැබේ. ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සේවා කොන්දේසි.**—මෙම පත්වීම් කරනු ලබන්නේ 1969 ඔක්තෝබර් මස පටන් ඊළඟ වර්ෂයේ අගෝස්තු මාසයේ අවසානය දක්වා එක් අධ්‍යයන වර්ෂයකටය. එහෙත් මෙම පත්වීම් අධ්‍යයන වර්ෂය තුළ කවර වේලාවකදී වුවද හේතුන් නොදන්වා අවසන් කිරීමට පුළුවන.

බාහිර කථිකාචාර්යවරුන් වාරය පටන් ගැනීමට පෙර තමන්ට දෙනු ලබන නිර්දේශ පත්‍ර අධ්‍යයන වර්ෂය තුළදී සම්පූර්ණ කිරීම පිණිස යොදන්ට අදහස් කරන කාර්ය මාලාව පටන් ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. එසේ ම අධ්‍යයන වර්ෂය තුළදී ඔවුන් පවත්වන දේශන සම්මත කරන ලද කාර්ය මාලාවට අනුව විය යුතුය.

වර්ෂයාවසාන පරීක්ෂණයට බාහිර පරීක්ෂකවරුන් පත් කෙරෙන අවස්ථාවලදී හැර අනිකුත් වාරවල පරීක්ෂණ හා වර්ෂාවසාන පරීක්ෂණවලදී තම තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් කිසිදු ගෙවීමක් නොලබා පරීක්ෂා කිරීමට බාහිර කථිකාචාර්යවරු සතුටු විය යුතුයි.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය.** —මෙහි දක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල වුනු ඉල්ලුම් පත් පිටපත් දෙකක් 1969.8.7 දිනට හෝ ඊට පෙර විද්‍යාලාධිපති, ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලය,
කොළඹ 7,
1969 ජූලි මස 12 වැනි දින.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

අංශය :————.

1. සම්පූර්ණ නම :————.
2. වයස :————.
3. පෞද්ගලික ලිපිනය (ටැලිෆෝන් අංකයක් ඇත්නම් එයද සඳහන් කරන්න) :————.
4. ව්‍යාපාර ලිපිනය (ටැලිෆෝන් අංකයක් ඇත්නම් එයද සඳහන් කරන්න) :————.
5. වෘත්තිය හෝ රක්ෂාව :————.
6. වෙනත් රක්ෂා තිබේ නම් ඒවා :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
8. වෘත්තීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
9. සිංහලෙන් පන්ති පැවැත්වීමට හැකි හෝ නොහැකි බව :————.
10. ඉගැන්වීමේ පළපුරුදුකම් ඇතිනම් ඒවා :————.
11. ප්‍රායෝගික සුදුසුකම් ඇති නම් ඒවා :————.
12. බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තු විෂයයන් :—

| පාඨමාලාව | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

13. සතියක් තුළදී ඔබට කළහැකි උපරිම දේශන ගණන :————.
14. ඔබ රජයේ සේවකයෙක් ද ? :————.
එසේ නම් කාර්යාල වේලාවන්ට පිටස්තරව දේශන පැවැත්වීමට සූදානම් ද ? :————.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

7–1055—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### රජයේ චිත්‍රපට ආයතනයේ සහකාර සැලසුම් සේවක මුද්‍රණකරු තනතුර

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රජයේ චිත්‍රපට ආයතනයේ සහකාර සැලසුම් සේවක මුද්‍රණකරු තනතුර සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘතිපත්‍රයේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1969. 8. 10 වැනි දිනට පළමු ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ 1, අංක 7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වෙත එවිය යුතුයි. ආකෘතිපත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " සහකාර සැලසුම් සේවක මුද්‍රණකරු " යන්න පැහැදිලිව ලිවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—120/180—රු. 5,340 වේ.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මුල් වතාවේ පත්වීම දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම යට දැක්වෙන අවශ්‍යතා සතුබව ඔප්පු වන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1969. 8. 10 වැනි දිනට වයසින් අවුරුදු 25 ට නො අඩු හා 45 ට නො වැඩි බව,
(ආ) මනා චරිතයකින් ද, කායික සෞඛ්‍යයෙන් ද, යුක්ත බව,
(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථය ලබා තිබෙන බව,
(ඈ) මි. මී. 35 සිනේ ඡායාරූප චිත්‍රපට සැලසුම් හා මුද්‍රණය පිළිබඳ අඩු වශයෙන් නොකඩවා අවුරුදු 2 ක පළපුරුද්ද සහ සිනේ ඡායාරූප ශිල්පය (කළු, සුදු සහ පාට) පිළිබඳ දැනීමක් තිබිය යුතුය. රසායනික සේදීම් පිළියෙල කිරීමේ සහ මි. මී. 35 සැලසුම් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීමේ දැනීමක් ද, අයදුම්කරුවන් සතුවිය යුතුය.

5. අයදුම්කරුවන් විසින් යට දැක්වෙන ලියකියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (**සැලකිය යුතුයි.**—බව්තීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහා නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.),
(ආ) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය,
(ඇ) අයදුම්කරුගේ සුදුසුකම් චරිතය සහ තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යත්වය දැක්වෙන මෑතකදී ලබාගත් සහතික තුනක් (රජයේ සේවයේ දැනටම යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙම උප ඡේදය යටතේ සහතික අනවශ්‍යය.)

**සැලකිය යුතුයි.**—මෙම ලියකියවිලිවල පිටපත් අයදුම්කරුවන් වෙත පෙරලා එවනු නොලැබේ.

6. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධයෙන් සෙසු ලියකියවිලි එවිය යුත්තේ කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ, අංක 7, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වෙතට මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ,

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවන රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි බලනු මනාය.

එම්. ජේ. තිසෙයිනායගම්,
වැ. බ. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1969. 7. 17 වැනි දින,
කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ,
අංක 7, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ අයදුම් පත

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ජාතිය :————.

(අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන්ද, පරම්පරාවෙන්ද යන වග :————.

(ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම් යට දැක්වෙන අය උපන් ස්ථාන දක්වන්න :—

(i) අයදුම්කරු :————.

(ii) අයදුම්කරුගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

සටහන.—අයදුම්කරු සහ ඔහුගේ පියා ලංකාවේ ඉපදී ඇත්නම් ඉහත (i) සහ (ii) පිරවිය යුතුය. අයදුම්කරු හෝ ඔහුගේ පියා ලංකාවෙන් පිටතදී උපන්නේ නම් (i) (ii) (iii) සහ (iv) ඡේදයන් සම්පූර්ණ කළ යුතුය.

4. උපන් දිනය :————.

5. විවාහකද නැද්ද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. සිංහල/දෙමළ පිළිබඳ සුදුසුකම් :————.

8. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු රැකියාවක යෙදුනේ කෙසේද ? :————.

9. දැන් රැකියාව :————.

10. සිනේ ඡායාරූප චිත්‍රපට විවෘධිය සහ මුද්‍රණය කිරීම පිළිබඳ පළපුරුද්ද :————.

11. ඔබේ අයදුම්පත සඳහා සැලකිල්ලට ගතයුතු යම්කිසි විශේෂ සුදුසුකම් තිබේ නම් ඒවා :————.

12. අයදුම්කරුගේ දක්ෂතාව සහ චරිතය පිළිබඳ විමසා බැලිය හැකි වැදගත් පුද්ගලයින් තිදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

13. චරිත සහතික (මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත් ඇමිණිය යුතුය) :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1073—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### III ශ්‍රේණියේ අනියම් විදුලි කාර්මික ඇබෑර්තු

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අංශයේ ඇති III ශ්‍රේණියේ විදුලි කාර්මික ඇබෑර්තු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 69. 8. 15 දින දක්වා අයදුම්පත් බාර ගනු ලැබේ.

1. **සුදුසුකම්.—**

(i) කියවීමට හා ලිවීමට පිළිවන් වීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) ගොඩනැගිලි වයර් කිරීම පිළිබඳ සාමාන්‍ය දැනීමක් තිබිය යුතුය.

(iii) බලමාර්ගවල වැඩ සඳහා අවශ්‍ය ආරක්ෂක උපදෙස් පිළිබඳව දැනීමක් තිබිය යුතුය.

(iv) චාලක ස්ටාටර ජනක හා ෆ්‍රෑන් බඳු විදුලි උපකරණ සවිකිරීම ගැන දැනුමක් තිබිය යුතුය.

2. **වයස.**—අවුරුදු 20ටත් 45ටත් අතර විය යුතුයි.

3. **වැටුප.**—දෛනික රු. 1.80 ක් වන අතර ආණ්ඩුවේ නියමයන්ට අනුව ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු ලැබේ.

4. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සහතිකවලට අතිරේකව පහත සඳහන් සහතික ද ඉදිරිපත් කළ යුතුය :—

(i) 1968 ජනවාරිවලට පසුව ගත් ග්‍රාම සේවක සහතිකය.

(ii) ග්‍රාමසේවක සහතිකවලට අතිරේකව වෙනත් සැලකියයුතු අයගෙන් ලබාගත් සහතික පත් 2ක්.

(iii) උප්පැන්න සහතිකය.

5. මෙම අයදුම්පත් පෞද්ගලික නමට නොව ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි), තැ. පෙ. අංක 6, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් කෙළවරේ විදුලි කාර්මික ඇබෑර්තු යයි සඳහන් කළ යුතුය.

6. නියමිත දිනට පසු ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. සී. ඩී. ද සිල්වා,
ප්‍රධාන නිර්මාන ඉංජිනේරු (ගොඩනැගිලි).

ර. වැ. දෙ,
තැ. පෙ. 6, මොරටුව.

7–1082—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයේ අන්දමට තමන්ගේම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1969.8.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ, තැ. පෙ. 563, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු අතර පුද්ගලිකව මා නමට හෝ මෙම කාර්යාලයේ අන්කිසි නිලධාරියකු නමට නො එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය, විශේෂ දීමනා හා සේවය පිළිබඳ කොන්දේසි.**—වාර්ෂිකව රු. 1,260 න් පටන් ගෙන රුපියල් 72 වාර්ෂික වැටුප් වැඩිවීම් 5 කින් හා රුපියල් 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 18 කින් ද යුක්තව රුපියල් 3,780 දක්වා උසස් වන වාර්ෂික වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ. වාර්ෂිකව රුපියල් 1,620 ට පෙර කාර්යක්ෂමතා කඩඉමෙකි.

තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රුපියල් 1,620 ට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ඔබ්බට උසස් කිරීම සඳහා දෙපාර්තමේන්තුමය පරීක්ෂණයකින් සමත් විය යුතුය. 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන අනුව සමත් විය යුතු සිංහල ප්‍රවීණතා පරීක්ෂණයාට අමතරව පත්වීමේ දින සිට අවුරුදු 3 ක් ඇතුළත දී දෙමළ භාෂාවෙන් කථනය හා අර්ථ නිරූපනය යන විෂයයන්ගෙන් සමන්විත පරීක්ෂණයකින් ද සමත් විය යුතුව ඇත. මෙම පරීක්ෂණය අසමත් වීම ඉන් පසුව යෙදෙන වේතනාධිකය විලම්බනය කිරීමට හේතුවේ.

3. **සේවාවට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් හිමි බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලාංකිකයකු බව,

(ආ) 1969.8.15 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි බව,

(ඇ) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය විෂයයක් වශයෙන් ගෙන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යෙන් හෝ උසස් විභාගයකින් සමත් වී ඇති බව,

(ඈ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය :—

(1) අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තිස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකවල පිටපත් භාරගනු නොලැබේ).

(2) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසු කම් පිළිබඳ සහතිකවල පිටපත්.

(3) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසු කම්, චරිතය, හැකියාව සහ වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික පත් තුනක පිටපත් (දැනට රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම සහතික පිටපත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලන්න.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1969 ජූලි මස 16 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යාලේඛන විමර්ශක තනතුර සඳහා අයදුම්පත

1. අයදුම් කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.
2. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
(පැහැදිලි අකුරෙන්)
3. උපන් දින හා උපන් ස්ථානය :————.
1969.8.15 දිනට වයස අවුරුදු :——, මාස :——, දින :——.
4. විවාහක නම්, විවාහ වූ දිනය හා ළමයින් ගණන :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමර්ථ වූ දිනය හා විෂයයන් ද සඳහන් කරන්න).
6. ඉගෙනීම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස් වූ දිනය :————.
7. දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප් : ————.
8. පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස්වූ දින (රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි) :————.
9. සිංහල හෝ දෙමළ කියවීම ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවය (සමර්ථ වූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුය) :————.
10. විශේෂ සුදුසුකම් (වෘත්තීය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු සමාජ සේවා වැඩ, ශුභ සාධක වැඩ) :————.
11. පිටපත් අමුනා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකු ගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.
12. අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1062—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ සංස්කාරක තනතුරු

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් විෂයයන් සඳහා II වැනි ශ්‍රේණියේ සංස්කාරක තනතුරුවලට ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මේ සඳහා එවනු ලබන අයදුම් පත්, දැන්වීම් අවසාන යෙහි දැක්වෙන ආකෘතියට අනුව සම්පූර්ණ කොට 1969.8.13 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුය.

| | | |
|---|---|---|
| ඉංජිනේරු විද්‍යාව | ... | සිංහල |
| ගණිතය | ... | සිංහල |
| සත්ත්ව විද්‍යාව | ... | සිංහල සහ දෙමළ |
| රසායන විද්‍යාව | ... | සිංහල සහ දෙමළ |
| උද්භිද විද්‍යාව | ... | සිංහල සහ දෙමළ |
| අධ්‍යාපනය | ... | සිංහල සහ දෙමළ |
| නීතිය | ... | සිංහල |
| ඉතිහාසය | ... | සිංහල සහ දෙමළ |
| වාණිජ විද්‍යාව | .. | සිංහල සහ දෙමළ |
| භූගෝල විද්‍යාව | ... | සිංහල |

2. වැටුප් ක්‍රමය :—

(i) උපාධිධාරීන්ට.—රු. 3,900—180×8 සහ 240×5—6,540 වාර්ෂික. (රු. 5,340 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය.)

(ii) උපාධිධාරීන් නොවන.—රු. 2,580—120×11 සහ 180×5—4,800 වාර්ෂික.

3. සේවා කොන්දේසි :—

මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—

(i) සෑම අයදුම්කරුවකු ම 1969.8.13 වන දිනට වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි. දැනට රජයේ සේවයේ නියුතු [illegible]න්ට උපරිම වයස් සීමාව බලෑ නොපානු ඇත.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත විය යුතු ය.

(iii) මෙහි යට දැක්වෙන විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලය කින් ලබාගත් සාමාන්‍ය උපාධියක් හෝ ගෞරව උපාධියක් තිබිය යුතු ය. උපාධියේ දී පළමුවන පෙළේ හෝ දෙවන පෙළේ සාමාර්ථයකට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) සිංහල/දෙමළ පිළිබඳ උසස් දැනුමක් තිබිය යුතු ය.

(v) ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. 5 වැනි ඡේදයේ සඳහන් ලිඛිත පරීක්ෂණයේ දී මේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

**සටහන.**—මෙම දෙපාර්තමේන්තුවේ සහ/හෝ රාජ්‍ය භාෂා දෙපාර්ත මේන්තුවේ ප්‍රකාශන අංශයේ අවුරුදු 5 කට නොඅඩු සතුටුදායක සේව යක් ඇති නිලධාරීන්ට ද, රජයේ භාෂා පරිවර්තක සේවයේ අවුරුදු 5 කට නොඅඩු සතුටුදායක සේවයක් ඇති නිලධාරීන්ට ද පහත සඳහන් සුදුසුකම් තිබේ නම් මේ තනතුරු සඳහා ඉල්ලුම්පත් ඉදිරි පත් කළ හැකි ය. ඉහතින් සඳහන් විෂයයන් සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ ඒ ඒ අවශ්‍ය විෂයයන් සහිත පහත සඳහන් විභාගවලින් සාමාර්ථය ලබා ඇති භවතුන්ගෙන් පමණි :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය/ප්‍රථම විභාග සහතිකය, හෝ

(ආ) ලංකා උසස් පාඨශාලා සහතිකය හෝ සමාන සුදුසුකමක්.

ඒ ඒ විෂයයන් සඳහා අවශ්‍ය සුදුසුකම් මෙසේ ය :—

**ඉංජිනේරු විද්‍යාව—සිංහල.**—ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ශුද්ධ ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් සහිත උපාධියක් හෝ තිබිය යුතු ය.

**ගණිතය—සිංහල.**—ගණිතය පිළිබඳ විශේෂ උපාධියක් හෝ ගණිතය සහ ව්‍යවහාර ගණිතය සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතුය.

**සත්ත්ව විද්‍යාව—සිංහල සහ දෙමළ.**—සත්ත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ සත්ත්ව විද්‍යාව සමඟ රසායන විද්‍යාව නැති නම් උද්භිද විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**රසායන විද්‍යාව—සිංහල සහ දෙමළ.**—රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ රසායන විද්‍යාව සමඟ ගණිතය සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතුය.

**උද්භිද විද්‍යාව—සිංහල සහ දෙමළ.**—උද්භිද විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ උද්භිද විද්‍යාව සමඟ රසායන විද්‍යාව නැතිනම් සත්ත්ව විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**අධ්‍යාපනය—සිංහල සහ දෙමළ.**—අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ දර්ශනය පිළිබඳ විශේෂ උපාධියක් හෝ අධ්‍යාපන ඩිප්ලෝමා සහිත දර්ශනය ඇතුළු උපාධියක් හෝ තිබිය යුතු ය. සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ තිබිය යුතු ය.

**නීතිය—සිංහල.**—නීතිය පිළිබඳ උපාධිය හෝ නීතිය සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**ඉතිහාසය—සිංහල සහ දෙමළ.**—ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධියක් හෝ ඉතිහාසය සහ ආර්ථික විද්‍යාව හෝ භූගෝල විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**වාණිජ විද්‍යාව—සිංහල සහ දෙමළ.**—වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ වාණිජ පිළිබඳ ඩිප්ලෝමාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ ආර්ථික විද්‍යාව සහ භූගෝල විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**භූගෝල විද්‍යාව —සිංහල.**—භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ භූගෝල විද්‍යාව සහ භූ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

5. **බඳවා ගැනීමේ පිළිවෙල.**—ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

6. රාජ්‍ය සේවයේ යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මේ තනතුරුවලට ඉල්ලුම්පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානියන් මාර්ගයෙනි. ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් වූ විට ඉල්ලුම්පත් බාරගනු ලබන්නේ තෝරාපත් කර ගත හොත් නිලධාරීන් සේවයෙන් මුදවාලීමට හැකි යයි දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළහොත් පමණකි. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරනහොත් සලකා බලනු නො ලැබේ.

7. පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා නිකුත් කරන ලද සහතිකපත් භාර ගනු නො ලැබේ.) ;

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතක දී ලබා ගන්නා ලද සහතික දෙකක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ.) ;

(ඈ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඉ) සිංහලෙන් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික පත්‍රය.

8. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ සියළුම ලියකියවිලි මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ගේ පෞද්ගලික නමට නොව අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, අංක 58, " සිරිමතීපාය ", ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 3, කියා එවිය යුතු යි.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ පළ වූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම පිළිබඳ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

10. සෑම අයදුම්පතක් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයෙන් දින හතක් ඇතුළත එවැනි දැන්වීමක් නොලත් අයදුම්කරුවකු වෙතොත් වහාම ඒ බව අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් තැනට දැනුම්දිය යුතු යි. එසේ නොකළහොත් ඔහුගේ අයදුම්පත ගැන සලකා බැලීමට ඇති යුතුකම නැති වේ.

සෙනරත් වණිගතුංග,
වැඩ බලන අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
අංක 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
" සිරිමතීපාය ", තැ. පෙ. 520,
කොළඹ 3.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ II වැනි ශ්‍රේණියේ සංස්කාරක ධුරය සඳහා ඉල්ලුම්පත්‍රය

ඉල්ලුම් කරන විෂය......

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

 (අ) අගට යෙදෙන නම :————.

 (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. 1969.8.13 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :——, මාස :——.

4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.

5. උපන් ස්ථානය :————.

 (අ) ඉල්ලුම්කරුගේ :————.

 (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

 (ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.

 (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ පියා : ————.

6. ඉල්ලුම්කරු විවාහක ද? එසේ නැත්නම් විවාහයෙන් පසු පුරුෂයා හෝ භාර්යාව මැරුණු අයෙක් ද? :————,

7. ඉගෙනීම කළ පාඨශාලා හා විද්‍යාලවල නම් (ඇතුළත් වූ දිනය හා අස් වූ දිනය සඳහන් කළ යුතුයි.) :————.

8. උපාධියේ දී සමත් වූ විෂයයන් හා පන්තිය :————.

9. සිංහල භාෂාවෙන් ලැබූ උසස් ම සුදුසුකම් :————.

10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීම ද, කෘතහස්ත භාවය ද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර හා පත් වූ හා අස් වූ දින ද ලැබූ වේතනය ආදියෙහි විස්තර :————.

12. විශේෂ සුදුසුකම් හෝ පුහුණුවීම් එසේ නැතහොත් මේ සඳහා කිව හැකි වෙනත් කාරණා පිළිබඳ විස්තර :————.

13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිව හැකි ඥාතීන් නොවන තුන් දෙනෙකුගේ නම්, තරාතිරම හා ලිපිනය (මෙය පෞද්ගලික ජීවිතයේ අයදුම්කරු හොඳින් දන්නා හඳුනන අය විය යුතුයි. රාජ්‍ය සේවයෙහි නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය) :————.

14. වෙනත් කරුණු :————.

මේ අයදුම්පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1067—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1969. 8. 8 වෙනිදාට හෝ එදිනට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැ. පෙ. 535, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,860කින් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වර්ධකයන් 6කින් රු. 2,580 තෙක් නගින්නකි.

3. **වයස් සීමාව.**—1969. 8. 8 වෙනි දිනට අවුරුදු 24ට නොඅඩු විය විය යුතු අතර අවුරුදු 40කට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බලපවත්වන්නේ නැත.

4. **අපේක්ෂකයන්ට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම් :**

(i) ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ; හෝ

දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් යුත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක්,

(ii) ලන්ඩන්හි "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ පහත සඳහන් සහතික පත්‍ර නැතහොත් විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතික පත්‍ර ලබා තිබිය යුතුය.

(අ) විදුලි ඉංජිනේරු අභ්‍යාස—ප්‍රත්‍යවර්තකධාරාව/සරල ධාරාව—ප්‍රාරම්භක

(ආ) විදුලි ඉංජිනේරු අභ්‍යාස—ප්‍රත්‍යවර්තකධාරාව/සරල ධාරාව—මධ්‍යම

(iii) කිලොවොට්ස් 175 තෙක් (එම ප්‍රමාණයන් ඇතුළුව) විදුලි බල සම්පාදන ඒකකයන් සම්බන්ධව කටයුතු කරන පිළිගත් වැඩපොළෙහි යටත් පිරිසෙයින් 5ක් වර්ෂයකවත් පළපුරුද්ද ලබා තිබිය යුතුය.

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්ය යන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය භාරගනු නො ලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

(ඇ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික.

(ඉ) චරිත සහතික දෙකක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු යි.

ඩබ්. එල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

### අයදුම්පත්‍රයෙහි ආකෘතිය

#### III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—

(i) පරම්පරාවෙන් ද :————.

නැතහොත්

(ii) ලියාපදිංචි වීමෙන් ද ————.

5. සමත් වූ උසස්ම විභාගය (විෂයයන් සඳහන් කළ යුතුයි.) : ————.

6. සමත්වූ කාර්මික විභාගය :————.

7. පළපුරුද්ද :————.

8. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.

9. දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

10 මේ අයදුම් පතෙහි මවිසින් සපයනු ලැබූ විස්තර සත්‍ය බවත්, නිවරුදි බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතු වන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

7–995—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද හමුදාව—සෙබු නිල පත්වීම්

1. ලංකා යුද හමුද නිත්‍ය හට සේනාවට සෙබළුන් වශයෙන් ඉදුරාම බඳවාගැනීම පිණිස ඇබැර්තු තිබේ.

(අ) මෙම ඇබැර්තු පිරවීම පිණිස පත්වීම් ඉදිරියෙන් දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| පත්වීම් | ඒකකය | අවශ්‍ය විශේෂ සුදුසුකම් |
|---|---|---|
| (i) ඉංජිනේරු සෙබල (වැඩ පිළිබඳ පෝර්මන් ගොඩනැගිලි) "ඒ" ඝණය—III වන ශ්‍රෙණිය | කාර්ය සේවා ලංකා ඉංජිනේරු ... | අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ හෝ හාර්ඩි කාර්මික පුහුණු කිරීමේ ආයතනයේ සිවිල් ඉංජිනේරු අංශයේ ඕනෑම පාඨමාලාවකින් ගොඩනැගිලි තැනීම පිළිබඳ විෂයයන් ඇතුව පළමුවන අවුරුද්ද සම්පූර්ණ කර තිබිය යුතුයි. |
| (ii) ඉංජිනේරු සෙබළ (වැඩ පිළිබඳ පෝර්මන්, විදුලි හා යාන්ත්‍රික) "ඒ" ඝණය—III වන ශ්‍රෙණිය | කාර්ය සේවා ලංකා ඉංජිනේරු ... | අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ හෝ හාර්ඩි කාර්මික පුහුණු කිරීමේ ආයතනයේ ඕනෑම පාඨමාලාවකින් පහත සඳහන් විෂයයන් එකකින් සමත් වී සිටිය යුතුයි :—<br>විද්‍යුතය හා චුම්බකත්වය<br>විද්‍යුත් මූලධර්ම<br>විද්‍යුත් ශිල්පීය විද්‍යාව 1 |
| (iii) ඉංජිනේරු සෙබළ (කාර්මික ලිපිකරු) "බී" ඝණය—III වන ශ්‍රෙණිය | කාර්ය සේවා ලංකා ඉංජිනේරු ... | අයදුම්කරුවන් යතුරු ලියනය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් හයක් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී සිටිය යුතුයි (හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය). |
| (iv) ඉංජිනේරු සෙබළ (කාර්මික ගබඩාකරු) "බී" ඝණය—III වන ශ්‍රෙණිය | කාර්ය සේවා ලංකා ඉංජිනේරු ... | අයදුම්කරුවන් ගණන් තැබීම සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් හයක් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී සිටිය යුතුයි (හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය). |

<table>
<tr><th>පත්වීම</th><th>ඒකකය</th><th>අවශ්‍ය විශේෂ සුදුසුකම්</th></tr>
<tr><td>(v) ඉංජිනේරු සෙබළ (සැලසුම්කරු) "ඒ" සණය—III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු ...</td><td>අයදුම්කරුවන් මූලික ගණිතය සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් හයක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී සිටිය යුතු අතර (හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය) ලංකා කාර්මික විද්‍යාලයේ හෝ හාර්ඩි කාර්මික පුහුණු කිරීමේ ආයතනයේ සැලසුම් සම්පාදනය පිළිබඳ අවුරුද් දක (සම්පූර්ණ කාල) දිවා පාඨමාලාවක් සම්පූර්ණකර තිබිය යුතුයි.</td></tr>
<tr><td>(vi) ඉංජිනේරු සෙබළ (පෙදරේරුවන්) "බී" සණය III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු</td><td rowspan="5">සියලුම අයදුම්කරුවන් 7 වෙනි ප්‍රමාණයෙන් සමත් විය යුතු අතර පහත දක්වෙන සුදුසුකම්වලින් එකක් ද අමතරව තිබිය යුතු වේ :—<br>(අ) කාර්මික ශිල්පීන් යටතේ සඳහන් කරන ලද වෘත්තියයන් එකක්, කම්කරු දෙපාර්තමේන්තුව මගින් හෝ කාර්මික විද්‍යාලය මගින් හෝ පවත්වන ලද වෘත්තීය පුහුණු කිරීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති බවට සහතිකය<br>හෝ<br>(ආ) කාර්මික ශිල්පීන් යටතේ සඳහන් කරන ලද වෘත්තියයන් එකක්, අඩු වශයෙන් අවුරුදු 3ක් නොකඩවා සේවය කර ඇති බවට පිළිගත් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් සහතිකය<br>අයදුම්කරුවන් ඉල්ලුම් කරනු ලබන වෘත්තිය ඉල්ලුම්පත් වල පැහැදිළිව සඳහන් කළ යුතු වේ. 6 සිට 10 දක්වා ඇති පත්වීම් සඳහා, පත්වීම් එකකට වැඩි ගණනක් ඉල්ලුම් කරන අපේක්ෂකයින් එක් තනතුරක් සඳහා එක අයදුම්පත බැගින් ඉදිරිපත් කළ යුතුයි.</td></tr>
<tr><td>(vii) ඉංජිනේරු සෙබළ (වඩු කාර්මිකයන්) "බී" සණය—III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු</td></tr>
<tr><td>(viii) ඉංජිනේරු සෙබළ (විදුලි කාර්මිකයන්) "ඒ" සණය—III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු</td></tr>
<tr><td>(ix) ඉංජිනේරු සෙබළ (නල මාර්ගකරුවන්) "බී" සණය—III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු</td></tr>
<tr><td>(x) ඉංජිනේරු සෙබළ (පැස්සුම්කරුවන්) "බී" සණය—III වන ශ්‍රෙණිය</td><td>කාර්ය සේවා ලංකා ඉංජිනේරු</td></tr>
<tr><td>(xi) සාමාන්‍ය සෙබළ (වේවැල් වියන්නන්) ...</td><td>ලංකා යුදහමුද සේවා බලකාය ...</td><td>අයදුම්කරුවන් වයස අවුරුදු 18–30ටත් අතර විය යුතුයි. සිංහල/දෙමළ/ඉංග්‍රීසි 5 වෙනි පන්තිය සමත්ව සිටිය යුතුයි. වේවැල් විවීම සම්බන්ධව අවුරුදු තුනකට නොඅඩු කාලයක පළපුරුද්දක් තිබිය යුතුයි.</td></tr>
</table>

(ආ) හුරුකම් හා කර්යක්ෂමතාවය මැනගැනීම සඳහා තෝරාගැනීමට පෙර අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ඇත.

(ඇ) ඉහත සඳහන් 1 වන ඡෙදයේ (අ) යටතේ ඇති ඇබෑර්තු සඳහා "විශේෂ සුදුසුකම්" නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

2. **සාමාන්‍ය කොන්දේසි.**—ඉහත සඳහන් 1 වන ඡෙදයේ (අ) යටතේ දක්වා ඇති විශේෂ සුදුසුකම්වලට අමතර වශයෙන් යුද හමුදවට ඉදුරාම බැඳෙන සෙබලකු ලෙස බැඳීම සඳහා පහත සඳහන් සාමාන්‍ය කොන්දේසි සපුරා ලිය යුතුය :—
අයදුම්කරුවකු—

(අ) ලාංකිකයකු විය යුතුය,

(ආ) 1969.8.10 වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු වද, වයස අවුරුදු 40ට නොවැඩිවද සිටිය යුතුය,

(ඇ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පස්වන පන්තිය සමත් විය යුතුය,

(ඈ) යුද හමුද ආඥපතිගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම, හා

(ඉ) උස අඩි 5 අඟල් 4ට අඩු නොවිය යුතුය.

කෙසේ වෙතත් යුද හමුද ආඥපතිගේ අනුමැතිය ඇතිව විශේෂ අවස්ථාවලදී අවුරුදු 40ට වැඩි වන හෝ අඩි 5 යි අඟල් 4ට අඩුවෙන් උස ඇති හෝ අවුරුදු 40ට වඩා වයස්වූ හා උස අඩි 5 අඟල් 4ට අඩුවූ අයද බඳවා ගත හැක.

3. මේ තනතුරු සඳහා ඉදිරිපත් වන සේවාමුක්ත භටයෙක් වේ නම් ඉහත දක්වන ලද සුදුසුකම් වලට අමතර වශයෙන්—

(අ) තමා ලංකාරක්ෂක හමුදවේ ඇතුළු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුදු එකකට නොඅඩු කාලයක් සේවය කර ඇති බවට හා

(ආ) යුද සේවයෙන් අස්වීමේදී හෝ අස් කරනු ලැබීමේදී හේවා චරිතය ("ඉතා හොඳ") යයි වර්ග කර තිබිය යුතුය.

4. **සේවා කාලය.**—අවුරුදු 12ක සේවා කාලය සඳහා බඳවා ගනු ලබන සෙබලකු පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදවේද සේවය කිරීමෙන් පසු අස් කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලකුට සවකීය නිත්‍ය භට හමුදවේ සේවය අවුරුදු 12 දක්වා දික් කරනු ලැබීමටත් අවුරුදු 32 දක්වා එහිම සේවය කිරීමටත් ඉඩ තිබේ.

5. **වැටුප් හා දීමනා.**—යුද හමුද නිත්‍ය භට සේනාවේ සෙසු නිල දරණ සෙබලුන් සඳහාවූ වැටුප් හා දීමනා 1961 අප්‍රියෙල් මස 28 වන දින අංක 12,395 දරණ රාජ්‍ය නිවේදිත පත්‍රයේ පලවුණු 1961 යුද හමුද වැටුප් සංග්‍රහයේ 1 වන කොටසට අනුකුලවනු ඇත.

**වැටුප වෘත්තියක් නොමැති සෙබලුන්.**—1961 යුද හමුද වැටුප් සංග්‍රහයට අනුකූලව සාමාන්‍ය සෙබලාගේ හෝ සමාන නිල දරන්නකුගේ සිට වෘත්තියක් නොමැත්තකු වන බලලත් නිලධාරි 1 දක්වා බඳවා ගැනීමේදී 1961 යුද හමුද වැටුප් සංග්‍රහයට අනුව ගෙවනු ලබන මූලික මාසික වැටුප පහත සඳහන් අයුරුය:–

| නිලය | මූලික මාසික වැටුප රු. | ශ. |
|---|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිල දරන්නකුට ... ... | 70 | 0 |
| ලාන්ස් කෝප්‍රල් ... ... ... | 85 | 0 |
| කෝප්‍රල් ... ... ... ... | 115 | 0 |
| සැරයන් ... ... ... ... | 180 | 0 |
| මාණ්ඩලික සැරයන් ... ... ... | 202 | 50 |
| බලලත් නිලධාරි 2 ... ... ... | 220 | 0 |
| රෙජමේන්තු උපකරණ පාලක සැරයන් ... | 235 | 0 |
| බලලත් නිලධාරි 1 ... ... ... | 250 | 0 |

(ආ) වැටුප වෘත්තීය සෙබලුන්.—කෝප්‍රල් නිලය හෝ ඊට සමාන නිලය හෝ පහත් නිලයක් දරණ, වෘත්තීයයකට බඳවා ගන්නකු වශයෙන් ගැනෙන සෙබලකුගේ වැටුප යථෝක්ත ගණය, ගණය තුළවූ පන්තියට අනුකූලව ඔහුට නියමිත වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| නිලය | | "එක්ස්" ගණයේ වෘත්තීන් | | | "ඒ" ගණයේ වෘත්තීන් | | | "බී" ගණයේ වෘත්තීන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය | ... | 1,470... | 1,170... | 1,020... | 1,350... | 1,110... | 960... | 1,260... | 1,050... | 930 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය | ... | 1,620... | 1,320... | 1,170... | 1,500... | 1,260... | 1,110... | 1,410... | 1,200... | 1,050 |
| කෝප්‍රල් හෝ සමාන නිලය | ... | 1,980... | 1,680... | 1,530... | 1,860... | 1,620... | 1,470... | 1,770... | 1,560... | 1,410 |

සැරයන් නිලය හෝ සමාන නිලය හෝ උසස් නිලයක් දරණ වෘත්තීයයකට බඳවා ගන්නකු වශයෙන් ගැනෙන සෙබලකුගේ වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| නිලය | | උසස්ම පෙළ වෘත්තීය සෙබලුන් | | | සෙසු වෘත්තීය සෙබලුන් |
|---|---|---|---|---|---|
| | | "එක්ස්" ගණය—පන්තිය 1 | | "ඒ" ගණය—පන්තිය 1 | | "බී" ගණය—පන්තිය 1 |
| | | රු. | | රු. | | රු. |
| සැරයන් හෝ සමාන නිලය ... | ... | 2,520 | ... | 2,430 | ... | 2,280 |
| මාණ්ඩලික සැරයන් හෝ සමාන නිලය | ... | 2,880 | ... | 2,790 | ... | 2,550 |
| බලලත් නිලධාරී, 2 වන පන්තිය ... | ... | 3,180 | ... | 3,000 | ... | 2,760 |
| රෙජමේන්තු උපකරණ පාලක සැරයන් | ... | 3,360 | ... | 3,180 | ... | 2,940 |
| බලලත් නිලධාරී, 1 පන්තිය ... | ... | 3,540 | ... | 3,360 | ... | 3,120 |

(ඇ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල.—රජයේ ගෙවීම් ක්‍රමයට ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල පහත සඳහන් වර්ගවලට අයත් සෙබලුන්ට ගෙවනු ලැබේ :—

(i) හමුදා වියදමෙන් ආහාර නොසැපයෙන විවාහක සෙබලා,

(ii) හමුදා නිවාසවලින් බැහැරව විසීමට අවසරලත් අවිවාහක සෙබලා හා

(iii) හමුදා නේවාසිකාගාරයෙන් ආහාර නොගෙන නිවාඩු ලබා සිටින අවිවාහක සෙබලා.

හමුදා වියදමෙන් ආහාර සපයනු ලබන අවිවාහක හෝ විවාහක සෙබලෙකුට හිමිවනුයේ—

(i) රජයේ ගෙවීම් ක්‍රමයට අනුකූලවූ ජීවනාධාර මුදලේ හා විශේෂ ජීවනාධාර මුදලේ එකතුව හා

(ii) යුද හමුදා ආඥපති විසින් නිගමනය කරන ආහාර සැපයීම පිණිසවූ වියදම් අතර වෙනසය.

(ඈ) ගෙවල් කුලී.—සේවා හෝ රජයේ නිවාසවල නොවෙසෙන විවාහක සෙබලුන්ට හා නේවාසිකාගාරවල ඉඩ පහසුකම් නොමැති හෝ රජයේ නිලධාරීන් සඳහාවූ දීමනා හා කොන්දේසි අනුව ඔහුගේ පත්වීමට දෙනු ලබන විශේෂ නිවාස නොමැති අවිවාහක සෙබලාට ගෙවල් කුලී ගෙවනු ලැබේ. විවාහකයන් සඳහාවූ රජයේ හෝ සේවා නිවාසවල වෙසෙන සෙබලෙකු ගෙවල් කුලී දීමනාවට අහිමිවනු ඇත.

(ඉ) රජක දීමනා.—(i) නේවාසිකාගාරයේ සිටින සෙබලෙකුගේ නිල ඇඳුම් හමුදා වියදමෙන් සෝදා දෙනු ලැබේ.

(ii) හමුදා නිවාසයන්ගෙන් බැහැරව වෙසෙන සෙබලෙකු ඔහුගේ නිල ඇඳුම් සේදීම පිණිස යුද හමුදා ආඥපති විසින් නිගමනය කරනු ලබන දීමනාවට හිමිකරු වනු ඇත.

(ඊ) සේවා වැඩිවීම.—සෑම සෙසු නිල දරන්නකුටම සේවා වැඩිවීම් වශයෙන් ගණන් ගැණෙන පස් අවුරුදු සේවා කාලයකට මසකට රුපියල් 4.50 බැගින් ගෙවනු ලැබේ.

(උ) නිල වැඩිවීම.—කෝප්‍රල් සිට බලලත් නිලධාරී II දක්වා නිල වැඩිවීම් වශයෙන් එම නිලයේ සෑම සිව් අවුරුදු සේවා කාලයට රුපියල් 7.50 බැගින්ද, බලලත් නිලධාරී I දරණ අයෙකුට සිව් අවුරුදු සේවා කාලයට රුපියල් 15.00 බැගින්ද ලැබෙනු ඇත. කෝප්‍රල් සිට සමාන නිල දරන්නකුට හිමිවනුයේ නිල වැඩිවීම් හතරක් පමණි.

(ඌ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල.—සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම මූලික වැටුපෙන් 4%ක මුදලක් අඩුකරගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් යුද හමුදාවට බැඳීමේදී සෑම සෙබලෙකු විසින්ම දිය යුත්තේය.

6. ඉහත සඳහන් (1) වන ඡෙදයේ (අ) හි දක්වෙන ඉදුරාම බඳවා ගැනීම පිළිබඳ ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීතිවලට අනුකූල විය යුතුය :—

(අ) ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනයේ අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍ර " යුද හමුදා ආධුනිකයන් බඳවන නිලධාරී, යුද හමුදා මූලස්ථානය, තැ.පෙ. අංක 553, කොළඹ " යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද එය බහා ලනු ලබන කවරය මතුපිටද " ඉල්ලුම් පත්‍රය—නිත්‍ය බල සේනා සෙනු නිල පත්වීම් " යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර 1969 අගෝස්තු මස 10 දින සවස 4.30ට පෙර යුද හමුදා මූලස්ථානයට ලැබිය යුතුය.

(ඇ) ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින තනතුර සහ ඒකකය නිවැරදිව සඳහන් කළ යුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කර ඇති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් නිකුත කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. බෞතීස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාර ගනු නොලැබේ.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය,

(iii) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතදී ලබාගත් සහතික 3ක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුයි.

සැලකිය යුතුයි :

(i) මෙම සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණකි.

(ii) ඉල්ලුම් පත්‍ර සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට යුද හමුදා මූලස්ථානය වග කියනු නොලැබේ.

(ඉ) තැපැලේදී නැතිවුණ, ප්‍රමාද වන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම් පත්‍රය සමග ස්වකීය ලිපිනය ලියන ලද (මුද්දර නොගසන ලද) කවරයක් බහා එවනු ලැබුවහොත් පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුණබව දන්වනු ලැබේ. එසේ නොමැති නම් ලැබුණ බව දන්වනු නොලැබේ.

(උ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය.

(ඌ) දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත්‍ර භාරගන්නා දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර, භාරගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවලට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(එ) සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුයයි තෝරාගනු ලබන අයදුම් කරුවන්, තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගෙ වියදමෙන්ම පැමිණ පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම් කරුවනට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(ඒ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසුයයි තෝරාගන්නා ලද ඉල්ලුම් කරුවන්, වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේ වියදමෙන්ම කොළඹදී පෙනී සිටිය යුතුය.

(ඔ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද හමුද තේරීම මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණ වලින් පසුව යුද හමුද නිත්‍ය භට සේනාවට බඳවා ගන්නා අතර යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන් තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඕ) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමාපියන්ගෙන් හෝ භාරකාරයාගේ කැමැත්ත පලමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය භට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ක) තෝරා පත්කරගත් සැම ඉල්ලුම් කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කල යුතුය.

(ග) ඉල්ලුම් කරු රෙකමදරු කිරීමට කැමැති කෙනකු වේ නම් ඔහු විසින් ඉල්ලුම් කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම් කරුවකුගේ තෝර ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

(ජ) යම් ඉල්ලුම් කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්කරණු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුනිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුදහමුද ආඥාපතී වෙනුවට.

යුද හමුද මූලස්ථානය,
කැ. පෙ. 553,
කොළඹ,
1969 ජූලි මස 18 දින,

## නිත්‍ය භට සේනාවේ සෙසු නිල පත්වීමක් පිළිබඳව වූ ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————. වයස :———— අවුරුදු :————. මාස :————.

4. දින සහිත සමත් වූ විභාග, විශයයන් සමඟ :————.

5. ඉල්ලුම් කරන තනතුර :————.
(මෙම නිවේදනයේ (1) වන ඡෙදයේ (අ) හි දක්වා ඇති පරිදි පත්වීම සහ ඒකකය සඳහන් කල යුතුය.)

6. මෙම නිවේදනයේ (1) වන ඡෙදයේ (අ) හි දක්වා ඇති පරිදි පත්වීම සඳහා සුදුසුකම් හා පලපුරුද්ද ඔබට තිබේද ? ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර ————.

7. පාසැලෙන් හෝ විද්‍යාලයයෙන් අස්වූවාට පසුව යෙදී සිටි රක්ෂාව :————.

8. උස :————. අඩි :————. අඟල් :————.

9. ජාතිය :————.

10. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

11. කලින් කරණ ලද සමාන පත්වීම් පිළිබඳ විස්තර, තනතුර සහ දින සහිතව :————.

12. මීට ප්‍රථම, යුද, නාවික, ගුවන් හා ස්වේච්ඡා සේවක හමුදවල (යුද සේවය ඇතුලුව) දරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දින ඇතුලුව සම්පූර්ණ විස්තර :————.

13. යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේ දී චරිතය :————.
(සේවාමුක්ත භටයෙක් වේ නම් යුද සේවයෙන් අස්වීමේ දී/අස්කිරීමේ දී ලබාගත් සහතික පිටපත් ඇමිණිය යුතුය.)

14. වෙනත් සුදුසුකම් (ක්‍රිඩා ආදිය) :————.

15. ඉදිරිපත් කරණ ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු (මෙම නිවේදනයේ (6) වන ඡෙදයේ (ඇ) බලන්න) :————.

(1) ————.

(2) ————.

(3) ————.

16. ඉල්ලුම්කරු අත්සනින් කර සිටින ප්‍රකාශය :————.
ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයන ලද පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කරමි.

දිනය :————.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

7-1143—69.7.25.දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## අක්කරෙයිපත්තු ගම්සභා කොට්ඨාශය

### හදිසි මරණ පරීක්ෂක තනතුර

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීගේ බල ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම් පත් පහත දක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙලකර 1969 අගෝස්තු මස 10 දින දහවල් 12 ට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි. මේ දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

බල ප්‍රදේශ

| | |
|---|---|
| (1) කට්ටයිකාඩු 597 | ග්‍රාම සේවක කොට්ඨාශ |
| (2) කොන්තන්තිවු 598 | |
| (3) කඩයාමොට්ටෙයි 599 | |
| (4) වීරුතෝඩෙයි 601 | |
| (5) තේතාපොල 603 | |
| (6) නාවක්කාඩු 605 | |

2. මෙම තනතුරු සඳහා සවිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම—

(අ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බවට හෝ අවුරුදු 60 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) අක්කරෙයිපත්තු ගම්සභා ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය තුළ සවිර පදිංචිකරුවකු බවට,

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි සවභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවටත් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. ඉන් එකක් ග්‍රාම සේවකයෙන් විය යුතුයි.

(ඈ) සවිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
දිසාපති,
පුත්තලම.

දිසාපති කාර්යාලය,
පුත්තලම. 1969.7.10.

**ආදර්ශ අයදුම් පත**

අක්කරෙයිපත්තු ගම්සභා කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිකුත් නම් :————.
   (ඇ) ලිපිනය :————.
2. සවිර පදිංචි සථානය හා එහි පදිංචි කාලය :————.
3. (අ) 196 මස වැනි දිනට වයස :—
   අවු :——, මාස :——, දවස් :——.
   (ආ) උපන් දිනය හා සථානය :————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. දැනට කරන රක්ෂාව :————.
7. ණයගැති වී තිබේ ද ? එසේ නම් විස්තර :————.
8. තමා සතු දේපලවල ප්‍රමාණය හා වටිනාකම :————.
9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් විස්තර :————.
10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුමට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා නිලයෙන් පහ කරනු ලැබීමට ද යටත් විය යුතු බව දනිමි. මෙම අයදුම්පතෙහි දක්වෙන සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–945—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## සමාජසේවා දෙපාර්තමේන්තුව

### රැකවල්කරු (ස්ත්‍රී) තනතුරු

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ රැකවල්කරු (ස්ත්‍රී) තනතුරු සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කරගත යුතු ඉල්ලුම් පත්‍ර 1969.8.10 වැනි දින හෝ ඊට පෙර කොළඹ 3, බාලදක්ෂ මාවත, ගාලු මුවදොර, සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. මෙම තනතුරට අයත් වැටුප් පරිමානය වර්ෂයකට රු. 600/- 8×30—1×24—රු. 864 වේ.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. එසේ වුවද, මුලින් පත්වීම් සිදු කෙරෙන්නේ අර්ථසාධක අරමුදල් පදනමක් මතය. පත්වීම ලබන්නවුන්ට අංක 372 සහ 1957.4.29 වැනි දින භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූලව විශ්‍රාම වැටුප් තත්ත්වයක් ලබාගැනීමට සිය මනාපය ප්‍රකාශ කිරීමට හිමිකම් ලැබේ.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කාරියකම.—

(අ) ලාංකිකයකු විය යුතුය.

(ආ) 1969.8.10 දිනට වයසින් අවු. 19 ට නොඅඩු බවටත් අවුරුදු 30 කට නොවැඩි බවටත්,

සංලක්ෂ්‍යය : දෙපාර්තමේන්තු සේවිකාවන්ට මෙය බල පාන්නේ නැත)

(ඇ) 8 වන පන්තියෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් විය යුතුය.

සංලක්ෂ්‍යය : (දෙපාර්තමේන්තු අයදුම් කරුවන් සම්බන්ධ යෙන් මෙම අධ්‍යාපනික සුදුසුකම් ලිහිල් කිරීම දෙපාර්ත මේන්තු ප්‍රධානියාගේ අනුමැතිය අනුව කරනු ඇත.)

(ඈ) අපේක්ෂිකාවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් සහ මනා කාය ශක්තියකින් සිටිය යුතුය.

(ඉ) උස අඩි 5 අඟල් 4 ට අඩු නොවිය යුතුය.

(ඊ) අවිවාහක විය යුතුය.

5. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, නියමිත දිනට පෙර ලැබී ඇත්නම් හා ප්‍රමාදයට විලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඒවා පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස නැත්නම් පිළිගනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය. එවන ලද සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නොලැබේ).

(ආ) අධ්‍යාපනික සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික පත්‍ර.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව පිළිබඳ සහතික පත්‍ර දෙකක්.

7. අයදුම් පත් හෝ ඊට අදාල වෙනත් ලිපි ආදිය භෝ එවිය යුත්තේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුට පුද්ගලිකව නොවේ.

8. ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන කාණ්ඩයේ ආරම්භ යේ පලවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම සම්බන්ධ යෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

ආර්. එල්. තිරුවෙල්වම්,
සමාජසේවා අධ්‍යක්ෂ.

1969.7.15,
කොළඹ 3,
තැ. පෙ. 577,
බාලදක්ෂ මාවත,
ගාලු මුවදොර,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දීය.

ආකෘති පත්‍රය

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ රැකවල්කරු (ස්ත්‍රී) තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් ලියන්න):————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.

2. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3. (අ) 1969.8.10 වැනි දිනට නියමිත වයස :—
   අවු. ——, මාස ——, දින ——.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය)
   (ඇ) උස :— අඩි ——, අඟල් ——.

4. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙකු වන්නේ :—
   (i) පරම්පරාවෙන් ද :————.
   (ii) ලියාපදිංචි වීමෙන් ද :————.

5. (අ) අධ්‍යාපනික සුදුසුකම් :—
   (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.
   (ආ) වෘත්තීය සුදුසුකම් :————.
   (ඇ) විශේෂ සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

6. මේ භාෂාවන් හොඳහැටි කථා කිරීමට හා ලිවීමට ඔබට හැකිදැයි දන්වන්න.—
   (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.

7. පාසැලෙන් අස්වූ පසු යෙදී සිටි රැකීරක්ෂා පිළිබඳ විස්තර දක්වන්න.—

8. ඔබේ හැකියාවන් හා චරිතය පිළිබඳව අසා දැනගත හැකි ප්‍රසිද්ධ භවතුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දක්වන්න.—

9. අමුණන ලද චරිත සහතික පත් දුන් භවතුන් දෙදෙනකුගේ නම් සඳහන් කරන්න.—

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–983—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ නෝවුඩ් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩබුලත්ගම කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

නෝවුඩ් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අගෝස්තු 25 වෙනි දින හෝ එදිනට ප්‍රථම මවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ලේකම්.

1969 ජූලි මස 12 වෙනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දීය.

7–989—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදවිය ජනපදය කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර කට්ටුකුලම් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධූරය

පදවිය ජනපදය උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්‍යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාල, ග්‍රාම සේවක කාර්‍යාල, පළාත් පාලන ආයතන කාර්‍යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්‍යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්‍යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්‍යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අගෝස්තු 31 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සෝමපාල ගුණධීර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 ජූලි මස 12 වෙනි දින,
ත්‍රිකුණාමලයේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්‍යාලයේ දීය.

7–1090—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## මාණ්ඩලික අභ්‍යාසලාභී—පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

පරන්තන් හි, පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලයේ, කර්මාන්ත ශාලාවේ මාණ්ඩලික අභ්‍යාසලාභී වශයෙන් පත් කිරීම සඳහා රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි ලබාගත් පිළිගත් විද්‍යාලවල විද්‍යා උපාධිධරයන්ගෙන් හෝ ඉංජිනේරු (යාන්ත්‍රික, රසායන හෝ විදුලිත්) උපාධිධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, 1969.8.1 වන විට අවුරුදු 26 ට වැඩි නොවිය යුතුයි.

තෝරාගත් අයදුම්කරුවන්ට, පුහුණුව ලබන විට මසකට රු. 500—3×50—රු. 650 ක දීමනාවක් දෙනු ලැබේ. ඔවුන්ගේ පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කළ පසු නියමිත කාලයක් සංස්ථාවේ සේවය කරන බවට, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට අවශ්‍යවනවා ඇත. වැඩිදුර පුහුණුවීම පිණිස තෝරාගනු ලබන අයදුම්කරුවන් එතෙර යැවිය හැක.

සහතිකවල පිටපත් සමඟ අයදුම්පත් 1969 අගෝස්තු 8 වෙනි දින, පස්වරු 4.30 දක්වා සභාපති, පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය, අංක 21, අබ්දුල් කපූර් මාවත, කොළඹ 3, භාර ගන්නවා ඇත.

සභාපති,
පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය.

1969 ජූලි 18 වන දින,
21, අබ්දුල් කපූර් මාවත,
කොළඹ 3.

7–1093—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### දේශීය ආදායම් විමර්ශණ නිලධාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් 1969 ජූලි මස 11 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවී ඇති නිවේදනය වෙත අවධානය යොමු කරවනු ලැබේ.

ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ (සිංහල) 10 (II) ඡේදයේ, " 4 " ඒ " සිට " බී " දක්වා " යන වචන, " 4 " බී " සිට " සී " දක්වා " යනුවෙන් කියවෙන ලෙස සංශෝධනය කර ඇත.

ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය 1969 අගෝස්තු මස 14 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

එස්. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 515,
සැනෝට් චතුරශ්‍රය,
කොළඹ 1,
1969 ජූලි මස 18 දින දිය.

7–109—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය

### ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ III වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ III වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 69.8.19 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් මා වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වසරකට රු. 1,860—120×6—2,580 වේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම් :

(1) (i) රජයේ කම්හලේ හෝ වෙනත් ඒ හා සමාන රජයේ ආයතනයක පස් වසරක යාන්ත්‍රික ඉංජිනේරු හෝ යාන්ත්‍රික පරිපාලන ඕවර්සියර්වරයෙකු ලෙස ආධුනික පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

හෝ

(ii) ප්‍රායෝගික කාර්මික විද්‍යායතනයක අර්ධකාලීන දේශන යන් හදාරා ඇති සහ පිළිගත් පුද්ගලික ආයතනයක පස් අවුරුද්දක යාන්ත්‍රික ඉංජිනේරු ආධුනික පුහුණුවක් තිබීම.

හෝ

(iii) යාන්ත්‍රික—විදුලි, කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ දෑවුරුදු පාඨමාලාවක් සතුටුදායක ලෙස හදාරා තිබීම සහ ඊට අමතරව රජයේ දෙපාර්තමේන්තුවක යාන්ත්‍රික පරිපාලන ඕවර්සියර්වරයෙකු ලෙස තුන් අවුරුදු කාලයක් තුල සේවයක් කර තිබීම,

හෝ

සහකාර ෆෝර්මන් (යාන්ත්‍රික) තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම් ලැබෙන විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විභාගයෙන් සමත්ව තිබීම.

(2) වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර 35 ට වැඩි නොවිය යුතුය. (දනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් ලියකියවිලි (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.
(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකය.
(iii) තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් චරිත සහතික තුනක්.
(දනට රජයේ සේවයේ නියුක්ත අය විසින් එම සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

6. රජයේ සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලැබ නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ගැන සලකා බලන්නේ ඒවා නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා ප්‍රමාදයට සෑහෙන හේතු දක්වමින් ඔවුන් ඒවා පිළිගත යුතුයයි නිර්දේශ කරන්නේ නම් පමණී.

7. රජයේ සේවකයින්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා, නිලධාරියා පත්වීමක් ලැබීමට තෝරාගනු ලැබුවහොත් නිදහස් කරන බව සඳහන් කලහොත් පමණී.

8. අයදුම්පත් මගේ නමට හෝ මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ නමට නොව, " ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්), ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන අමාත්‍යාංශය. රත්මලාන " කියා එවිය යුතුය.

9. අයදුම්කරුවන් යම්කිසි නියමිත ස්ථානයකදී සහ වේලාවකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍යවනු ඇත. ඉල්ලුම්පත් වලට අමුණා එවන ලද සහතිකවල මුල් පිටපත් එම සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා හෝ ගෙවනු නොලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සේවා තනතුරු සඳහා අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ඩබ්. පද්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්)
පළාත් පාලන අමාත්‍යාංශය.

ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය,
පළාත් පාලන අමාත්‍යාංශය,
රත්මලාන.
1969.7.5.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

#### III ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුරු

#### පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය—රත්මලාන

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.
(ලිපිනයේ වෙනස්වීම් වහාම දන්විය යුතුයි.)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ පරම්පරාවෙන්ද, ලියා පදිංචිවීමෙන් නම් පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ සැසඳුම් අංකය හා දිනයත් සඳහන් කරන්න.)

4. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)
(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට තියම වයස : ————.

5. උපන් ස්ථානය :
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. විවාහක අවිවාහක බව :

7. (i) අධ්‍යාපනික සුදුසුකම් :————.
(ii) වෘත්තීය සුදුසුකම් :————.
(iii) වෙනත් විශේෂ සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණන්න.)

8. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුර, ලිපිනයන් :—
(i) ————.
(ii) ————.
(iii) ————.

9. පාසැලෙන් අස්වූවාට පසු කරන ලද රැකිරක්ෂා පිළිබඳ විස්තර :
(i) දරන ලද තනතුරු :————.
(ii) සේවා කාලය :————.
(iii) අස්වීමට හේතුව :————.

10. දැනට යෙදී සිටින රක්ෂාව :
(i) තනතුර, ශ්‍රේණිය, හා පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත/රහිත බව :————.
(iii) දනට ලබන මූලික වැටුප හා වැටුප් ක්‍රමය :————.

11. ගැසට් නිවේදනයේ 4(i) ඡේදය යටතේ ලබා ඇති සුදුසුකම් පැහැදිළිව දක්වන්න :
(i) ————.
(ii) ————.
(iii) ————.
(iv) ————.

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගනු ලැබීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :

7-1087—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1969

උක්ත විභාගය පිළිබඳව අංක 14,859 හා මැයි මස 9 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ. එම නිවේදනයේ 9.(ඒ) (iv) හා 9.(බී) (iii) යන ඡෙද කපා හැර ඒ වෙනුවට පහත සඳහන් ඡෙද යොද ඇත.

9. (ඒ) (iv) විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ප්‍රශ්න පත්‍ර දෙකයි.

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | — | පැය $1\frac{1}{2}$ යි | ලකුණු 200 යි |
| II පත්‍රය | — | පැය $2\frac{1}{2}$ යි | |

විද්‍යා පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තුවන අයදුම්කරුවන් සඳහා

9. (බී) (iii) විද්‍යාව—මේ පිළිබඳ 1 වෙනි පත්‍රයට භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් පිළිබඳව කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ඇතුළත් වේ. II වැනි ප්‍රශ්න පත්‍රයට භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් පමණක් ප්‍රශ්න අඩංගු වේ.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 ජූලි මස 15 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

7-1076—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### යතුරු ලියන රිබන් පටි සැපයීම

ලංකාණ්ඩුවේ අංක 14,861 හා 1969.7.4 දින ගැසට් පත්‍රයේ පළවූ ගැසට් නිවේදනයේ සැපයීම් අංක 3 "මේරට සෑදූ" යන වචන කපා හැරියා සේ, ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් සළකන්න. තවද දැන් මෙම සැපයීම කියවිය යුත්තේ ඉහත සඳහන් කර තිබෙන අන්දමටයි.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජූලි 25, කොළඹ දීය.

7-1147—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1969-70 මුදල් වර්ෂය තුළදී සීගිරිය, රාජාංගනය, යාපහුව, අනුරාධපුරය, පොළොන්නරුව, මැදිරිගිරිය, පඬුවස්නුවර, දැදිගම, මැණික්දෙන, රිටිගල, බුදුරුවගල, මිහින්තලේ, අම්පාරෙ, දිඹුලාගල, බෝතලේ, මගුල් මහා විහාරය, තිස්සමහාරාමය, පදවිය, මහනුවර, කුණ්ඩසාලේ, අම්බලංතොට, තිරියාය, මාලිගාවිල, පාදෙනිය, වෙල්ගම් වෙහෙර, (පෙරියකුලම) ගුරුදෙනිය, අරන්කැලේ, යාපනය, කන්දරෝඩේ, නිලාවලී සහ ගාල්ල යන ස්ථානවල පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ පොළවලට පොල් අතු, හුණු, වැලි, සක්ක ගල්, කබාපු කළුගල්, බොරළු සහ ගඩොල් සැපයීම සඳහා කොළඹ 7, පුරාවිද්‍යා කොමසාරිස් තැන විසින් 1969 අගෝස්තු 25 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුයි. එක් එක් ස්ථානය සඳහා ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 20 බැගින් එවිය යුතු අතර, 1969 අගෝස්තු 24 වෙනි දින පස්වරු 3 තෙක් ඉහත සඳහන් ස්ථාන සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම ඇප මුදල කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් හෝ මෙම කාර්යාලයට පැමිණ හෝ පුරාවිද්‍යා කොමසාරිස් තැන නමට මුදල්/තැපැල් ඇණවුමක් එවීමෙන් හෝ එවිය හැකිය.

3. වැඩිපුර විස්තර පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

රාජා ද සිල්වා,
වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්.

මගේ අංකය: ඇස්.ඇස්.62(වි)-69/70

1969 ජූලි මස 17 වැනි දින,
කොළඹ 7, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදීය.

7-111—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනා ගමන මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීම

බස් රථ ගමනාගමන තිර සඳහා අවශ්‍ය කපු රෙදි සම්පාදනය කිරීම පිණිස එව්නු ලබන මුද්‍රා තබන ලද ටෙන්ඩර්, කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1969 ක්වූ සැප්තැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10 වන තෙක් පමණි.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙරදින දවල් 12 වන තෙක් මගේ කායභීලයෙන් ලබාගත හැකි පෝර්ම පිටපත් දෙකකින් යුක්ත කොට ටෙන්ඩර් එවිය යුතුයි. ටෙන්ඩර් පෝරම ලබා ගැනීම පිණිස රුපියල් 100 ක ටෙන්ඩර් මුදලක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනා ගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත භාන්පත් කොට ලබාගත් කුවිතාන්සිය මගේ කායභීලයට ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර මගේ කායභීලයෙන් ලබාගන්න.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,<br>
ලංකා ගමනා ගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාශය,<br>
200, කිරුළ පාර,<br>
කොළඹ 5.

7–1092—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

**කොළඹ 8, කෝට්ටෙ පාරේ 325 දරන ස්ථානයේ පිහිටි ආයුර්වේද මහාරෝග්‍යශාලාවට වියළි, අමු, යුනානි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම.**

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලය තුල මෙහි පහත ඇති උප ලේඛනයේ සඳහන් පරිදි වියළි, අමු, යුනානි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි පිහිටි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969.8.18 වෙනි දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙළවරේ එය කුමන සේවයක් සඳහා ද යන වග පැහැදිලි ලෙස ලියා කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 දරන ස්ථානයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමාගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද කවරයෙහි සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි පිහිටි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස්තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතිනම් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමති නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලයලත් නිලධාරියා වන පළමු වැනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තුමාට පුද්ගලිකව භාරදිය හැකිය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරදුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

4. 1 වැනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියළුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන් ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට වුවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයෙ සභාපති සමඟ නියම කර ගත් වේලාවක පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත දැක්වෙන උප ලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොළඹ, යෝක් වීදියේ, ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරීගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් නොකෙරෙන තැන්පත් මුදල් බැංකුව භාර නොගන්නවා ඇත. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සිය 1969.8.17 වෙනි දින දවල් 12 ට පෙර, කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී කාර්යාලයේ වෛද්‍ය අධිකාරීතුමා වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල්වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

6. ආනයනය කර සැපයිය යුතු බෙහෙත් ද්‍රව්‍ය සඳහා අවශ්‍ය නම් විදේශ විනිමය වෙන්කර දෙනු ලැබේ. සියලුම ටෙන්ඩර්කරුවන් විසින්, තමන් ආනයනය කර සැපයීමට අදහස් කරනු ලබන ඖෂධ විෂයයන් එක එක සඳහා යන මෙරට තුල වියදම රුපියල්වලින්ද, හා ආනයනය කිරීම සඳහා පිටරට යැවිය යුතු විදේශ විනිමය ප්‍රමාණයද සඳහන් කළ යුතුය. අඩු විදේශ විනිමය ප්‍රමාණයක් වැය වන පරිදි ගණන් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ. ආනයනය කර සපයනු ලබන ඖෂධ විෂයයක් සඳහා විදේශ විනිමය වෙන් කරනු ලබන්නේ එම බෙහෙත් ද්‍රව්‍ය දේශීය වශයෙන් ලබා ගැනීමට හැකි හෝ නොහැකි කරුනු අනුවය.

7. කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද කොමසාරිස්තැනගෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව,<br>
ආයුර්වේද කොමසාරිස්.

කෝට්ටෙ පාර,<br>
කොළඹ 8,<br>
1969.7.17

### උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1969.10.1 සිට 70.9.30 (එම දෙදිනත් ඇතුලුව) දක්වා කාලසීමාව තුළ ආයුර්වේද මහාරෝග්‍යශාලාවට වියලි, අමු, යුනානි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහාය. | රු. 100 | ටෙන්ඩරයේ මුළු වටිනා කමින් සියයට පහක් | 1969. 8.18 |

7–1077/1—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1969-70 වර්ෂයේ අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට අමු, වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ අමු කොළ සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලය තුල මෙහි පහත ඇති උප ලේඛනවල සඳහන් පරිදි අමු, වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි පිහිටි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් 1969.8.18 වෙනි දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙළවරේ එය කුමන සේවයක් සඳහා ද යන වග පැහැදිලිව ලියා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ස්ථානයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද කවරයෙහි සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතිනම් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමති නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලයලත් නිලධාරියා වන පළමු වැනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තුමාට පුද්ගලිකව භාරදිය හැක. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරදුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

4. 1 වැනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියළුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදි ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන් ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට වුවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ආයුර්වේද කොමසාරිස් සමඟ නියම කර ගත් වේලාවට පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත දැක්වෙන උප ලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්මේන්තුවෙහි කොමසාරිස් ගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් නොකෙරෙන තැන්පත් මුදල් භාර නොගන්නවා ඇත. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සිය 1969.8.17 වෙනි දින දවල් 12 ට පෙර, කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කාර්යාලයේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල්වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

6. මෙහි දැක්වෙන උපලේඛන තුනම සඳහා හෝ එක් උපලේඛනයක් සඳහා හෝ ටෙන්ඩර්කරුවන්ගේ මනාපය පරිදි ටෙන්ඩර් කළ හැක.

7. ආනයනය කර සැපයිය යුතු බෙහෙත් ද්‍රව්‍ය සඳහා අවශ්‍ය නම් විදේශ විනිමය වෙන් කර දෙනු ලැබේ. සියලුම ටෙන්ඩර්කරුවන් විසින්, තමන් ආනයනය කර සැපයීමට අදහස් කරනු ලබන ඖෂධ විෂයයන් එක එක සඳහා යන මෙරට තුල වියදම රුපියල්වලින්ද, හා ආනයනය කිරීම සඳහා පිටරට යැවිය යුතු විදේශ විනිමය ප්‍රමාණයද සඳහන් කළ යුතුය. අඩු විදේශ විනිමය ප්‍රමාණයක් වැය වන පරිදි ගණන් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ. ආනයනය කර සපයනු ලබන ඖෂධ විෂයයක් සඳහා විදේශ විනිමය වෙන්කරනු ලබන්නේ එම බෙහෙත් ද්‍රව්‍ය දේශීය වශයෙන් ලබා ගැනීමට හැකි හෝ නොහැකි කරුණු අනුවය.

8. කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325, ආයුර්වේද කොමසාරිස්ගෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

කෝට්ටේ පාර,
කොළඹ 8.
1969.7.17

### උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1969.10.1 සිට 1970.9.30 (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාල සීමාව තුළ අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට පහත දැක්වෙන උපලේඛනවල සඳහන් බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා :— | " අ " රු. 50<br>" ආ " රු. 50<br>" ඇ " රු. 25 | ටෙන්ඩරයේ මුළු වටිනාකමින් සියයට 5 යි | 1968.8.18 |

" අ " උප ලේඛනය—වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය
" ආ " උපලේඛනය—අමු බෙහෙත් ද්‍රව්‍ය
" ඇ " උපලේඛනය—අමු කොළ

7-1077/2—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1969-70 වර්ෂයේ රත්නපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට අමු, වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ අමු කොළ සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලය තුල මෙහි පහත ඇති උප ලේඛනවල සඳහන් පරිදි අමු, වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය හා අමු කොළ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් විසින් 1969.8.18 වෙනි දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙළවරේ එය කුමන සේවයක් සඳහා ද යන වග පැහැදිලිව ලියා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද කවරයෙහි සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතිනම් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමති නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලයලත් නිලධාරියා වන පළමු වැනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට පුද්ගලිකව භාරදිය හැකිය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරදුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

4. 1 වැනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියළුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන් ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට වුවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ආයුර්වේද කොමසාරිස් සමඟ නියම කර ගත් වේලාවක පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත දැක්වෙන උප ලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස්ගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් නොකරන තැන්පත් මුදල් භාර නොගන්නවා ඇත. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් 1969.8.17 වෙනි දින දවල් 12 ට පෙර, කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කාර්යාලයේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර්පත් ඉල්ලුම් කරන අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල්වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

6. මෙහි දැක්වෙන උපලේඛණ තුනම සඳහා හෝ එක් උපලේඛණයක් සඳහා හෝ ටෙන්ඩර්කරුවන්ගේ මනාපය පරිදි ටෙන්ඩර් කළ හැක.

7. ආනයනය කර සැපයිය යුතු බෙහෙත් ද්‍රව්‍ය සඳහා අවශ්‍ය නම් විදේශ විනිමය වෙන්කර දෙනු ලැබේ. සියලුම ටෙන්ඩර්කරුවන් විසින්, තමන් ආනයනය කර සැපයීමට අදහස් කරනු ලබන ඖෂධ විෂයයන් එක එක සඳහා යන මෙරට තුළ වියදම රුපියල්වලින්ද, සහ ආනයනය කිරීම සඳහා පිටරට යැවිය යුතු විදේශ විනිමය ප්‍රමාණයද සඳහන් කළ යුතුය. අඩු විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන පරිදි ගණන් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ. ආනයනය කර සපයනු ලබන ඖෂධ විෂයයක් සඳහා විදේශ විනිමය වෙන් කරනු ලබන්නේ එම බෙහෙත් ද්‍රව්‍ය දේශීය වශයෙන් ලබා ගැනීමට හැකි හෝ නොහැකි කරුණු අනුවය.

8. කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325, ආයුර්වේද කොමසාරිස්ගෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

කෝට්ටෙ පාර,
කොළඹ 8,
1969.7.17

උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1969.10.1 සිට 1970.9.30 (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලසීමාව තුළ රත්නපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට පහත දැක්වෙන උප ලේඛනවල සඳහන් බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහාය :— | " අ " රු 50<br>" ආ " රු. 50<br>" ඇ " රු. 25 | ටෙන්ඩරයේ මුළු වටිනා කමින් සියයට 5 යි | 1969.8.18 |

" අ " උප ලේඛනය — වියළි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය

" ආ " උප ලේඛනය — අමු බෙහෙත් ද්‍රව්‍ය

" ඇ " උපලේඛනය — අමු කොළ

7–1077/3—69.7.25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1969–70 වර්ෂයේ නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයට අමු, වියළි, සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ අමු කොළ සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලය තුල මෙහි පහත් ඇති උප ලේඛනවල සඳහන් පරිදි අමු, වියළි, සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය හා අමුකොළ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් විසින් 1969.8.18 වෙනි දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙළවරේ එය කුමන සේවයක් සඳහා ද යන වග පැහැදිලි ලෙස ලියා කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයෙහි සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතිනම් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමති නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලයලත් නිලධාරියා වන පළමු වැනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට පුද්ගලිකව භාරදිය හැකිය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරදුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

4. 1 වැනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියළුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන් ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට වුවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ආයුර්වේද කොමසාරිස් සමඟ නියම කර ගත් වේලාවක පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත දැක්වෙන උප ලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස්ගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් නො කෙරෙන තැන්පත් මුදල් භාර නොගන්නවා ඇත. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් 1969.8.17 වෙනි දින දවල් 12 ට පෙර, කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කාර්යාලයේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල්වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

6. මෙහි දක්වෙන උපලේඛන තුනම සඳහා හෝ එක් උපලේඛනයක් සඳහා හෝ ටෙන්ඩර්කරුවන්ගේ මනාපය පරිදි ටෙන්ඩර් කළ හැක.

7. ආනයනය කර සැපයිය යුතු බෙහෙත් ද්‍රව්‍ය සඳහා අවශ්‍ය නම් විදේශ විනිමය වෙන් කර දෙනු ලැබේ. සියලුම ටෙන්ඩර්කරුවන් විසින්, තමන් ආනයනය කර සැපයීමට අදහස් කරනු ලබන ඖෂධ විෂයයන් එක එක සඳහා යන මෙරට තුල වියදම රුපියල්වලින්ද, හා ආනයනය කිරීම සඳහා පිටරට යැවිය යුතු විදේශ විනිමය ප්‍රමාණය ද සඳහන් කළ යුතුය. අඩු විදේශ විනිමය ප්‍රමාණයක් වැය වන පරිදි ගණන් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ. ආනයනය කර සපයනු ලබන ඖෂධ විෂයයක් සඳහා විදේශ විනිමය වෙන් කරනු ලබන්නේ එම බෙහෙත් ද්‍රව්‍ය දේශීය වශයෙන් ලබා ගැනීමට හැකි හෝ නොහැකි කරුණු අනුවය.

8. කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 ආයුර්වේද කොමසාරිස්ගෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

කෝට්ටේ පාර,
කොළඹ 8,
1969.7.17

## උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1969.10.1 සිට 70.9.30 (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලසීමාව තුළ නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයට පහත දක්වෙන උපලේඛනවල සඳහන් බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා :— | " අ " රු. 50<br>" ආ " රු. 50<br>" ඇ " රු. 25 | ටෙන්ඩරයේ මුළු වටිනා කමින් සියයට 5 යි. | 69.8.18 |

" අ " උප ලේඛනය — වියලි සහ සාමාන්‍ය බෙහෙත්
" ආ " උප ලේඛනය — අමු බෙහෙත්
" ඇ " උප ලේඛනය — අමු කොළ යනාදිය.

7–1077/4—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය මෝටර් රථය මිළයට ගැනීම

කොළඹ 3, බාලදක්ෂ මාවත, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969 අගෝස්තු මස 9 සෙනසුරාදා පෙ. ව. 9.30 වන තෙක් පහත සඳහන් මෝටර් වාහනය මිළට ගෙන ඉවත් කිරීම සඳහා ටැන්ඩර් භාරගනු ලැබේ :—

අංක ඊවයි 5606 දරණ විලිස් ජීප් රථය

2. කාර්යාල වේලාවන් තුළ මෙම කාර්යාලයේ දී රථය බැලිය හැකිය.

3. ටැන්ඩර් ඇප මුදල වශයෙන් රු. 100ක් කච්චේරියක හෝ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 3, බාලදක්ෂ මාවතේ සමාජ සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියූ ටැන්ඩර් පිටපත් දෙකක් ඇතිව එවිය යුතුය. කිසිවකුගේ ටැන්ඩර් පිළිගත් බව ඔහුට ලියුමකින් දන්වා පස් දිනක් ඇතුළත ඔහු ටැන්ඩරයේ සඳහන් කළ මුළු මුදල ගෙවීමට ප්‍රතික්ෂෙප කළහොත් හෝ එසේ ගෙවීමට නොහැකි වුවහොත් ඔහුගේ ඇපය රාජසන්තක කොට රථය වෙන ටැන්ඩර්කරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබේ. සඵලවූ ටැන්ඩර් හිමියා මුළු මුදල ගෙවා දින තුනක් ඇතුළත රථය දැනට තිබෙන ස්ථානයෙන් ඉවත් කළ යුතුය.

4. වර්ෂ 1969 අගෝස්තු මස 8 වැනි දින ප. ව. 3 දක්වා ටැන්ඩර් ආකෘතීන් නිකුත් කරනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ටැන්ඩර් "මෝටර් රථය මිළයට ගැනීමට ටැන්ඩර්" යනුවෙන් සටහන් කළ කොපුවක බහා ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 3, තැ. පෙ. 577, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුය.

6. තම ටැන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නට තීරණය කර ගන්නා ටැන්ඩර්කරුවන්, කොළඹ 3, බාලදක්ෂ මාවතේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මේ සඳහා තබා ඇති "ටැන්ඩර් පෙට්ටිය" තුළට ඒවා බහාලිය මනාවේ. ටැන්ඩර්කරුවාගේ නම හා ලිපිනය ලියුම් කොපුවේ ලිවිය යුතුය.

7. ටැන්ඩර්වල වෙනස් කරන ලද හෝ මකන ලද සෑම ස්ථානයකම ටැන්ඩර්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය.

8. ටැන්ඩර් භාරගැනීමේ අවසාන දිනයේ සිට සති 4 ක් ගතවන තුරු ටැන්ඩර්කරුවන් බලාපොරොත්තු ගණන් නොවෙනස්ව තබා ගතයුතු බව අපෙක්ෂිතය.

9. වර්ෂ 1969 අගෝස්තු මස 9 වැනි සෙනසුරාදා පෙ. ව. 10 ට කොළඹ 3, ගාලුමුවදොර, බාලදක්ෂ මාවතේ පිහිටි සමාජ සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ දී ටැන්ඩර් විවෘත කරනු ලැබේ.

10. ටැන්ඩර් විවෘත කරනු ලබන වේලාවෙහි පැමිණ සිටීමට කැමති නම් එසේ කිරීමට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

11. තුන්වන ඡේදයෙහි දැක්වෙන කොන්දේසියට යටත්ව ටැන්ඩර් ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

12. කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රශ්න විරහිතව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුව තිබේ.

13. වැඩිපුර විස්තර සමාජ සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකිවේ.

සමාජ සේවා අධ්‍යක්ෂ.

තැ. පෙ. 577,
1969. 7. 18 වැනි දින, කොළඹ දීය.

7–1098—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ත්‍රිකුණාමලය උප කොට්ඨාශය

ත්‍රිකුණාමලය උප කොට්ඨාශය යටතේ කට්කිඩංගු කුලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් පත් ත්‍රිකුණාමලයේ ඕර්සිල් කන්දෙහි ත්‍රිකුණාමල කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 අගෝස්තු මස 14 වන බ්‍රහස්පතින්දා පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ.

2. ඒ ඒ වැඩය සඳහා දී ඇති මිල ගණන් වූ රු. 40,000 හෝ ඊට වැඩි මුදල්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා සමුපකාර සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. 1969 අගෝස්තු 10 දින දක්වා කාර්යාල වේලාවන්වලදී ත්‍රිකුණාමලය ඇල්ලේ හා කන්තලේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ආකෘතිපත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත් සඳහා ඉල්ලුම්කරන විට ටෙන්ඩර් කරුවන් විසින් තමාගේ ලියාපදිංචි පොත දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරන වැඩ හා ඒවායේ වටිනාකම ද දැක්වෙන ප්‍රකාශනයක්, ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා, වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගැනීමට ඒ ඒ වැඩය සඳහා දී ඇති ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ පිළිබඳ වැඩි විස්තර ත්‍රිකුණාමලයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

ජී. බී. පෝල්,
වාරිමාර්ග ඉංජිනේරු,
ත්‍රිකුණාමලය උප කොටස.

ඇතුල්වරාය පාර,
ත්‍රිකුණාමලය,
69.7 15 දින.

7–1089—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේ ඇති හිස් ගෝනි, පරණ ප්‍රවෘත්ති පත්‍ර, හිස් සත්ව ආහාර බෑග් ආදිය මිලදී ගැනීම**

පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් 1969 අගෝස්තු 7 වෙනි දින උදේ 10.30 දක්වා වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරි තැන විසින් භාරගනු ලැබේ :—

| ද්‍රව්‍යයන් | ප්‍රමාණය |
|---|---|
| හිස් සත්ව ආහාර කඩදාසි බෑග් | 1,200 |
| හිස් පිටි ගෝනි | 600 |
| හිස් සත්ව ආහාර ගෝනි | 200 |
| හිස් හාල් ගෝනි | 375 |
| පරණ ප්‍රවෘත්ති පත්‍ර | රු. 153 |
| ගැලවනයිස් තහඩු කෑලි | රු. 224 |
| ගැලුම් 4 ප්‍රමාණයේ හිස් දුන් තෙල් ටිං | 30 |

2. ටෙන්ඩර් සඳහා රු. 10 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුය. එයට ලබා ගන්නා රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග අමුණා එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය බාර ගත් බව ලිපියකින් දන්වන ලදුව දින 7 ක් ඇතුලත නියම මිළ ගණන් ගෙවා ඉහත සඳහන් බඩු ගෙන යෑමට නොහැකි වන හෝ අකමැත්ත දක්වන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරණු ලැබේ. ටෙන්ඩරය බාර ගත් බව දන්වන ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළ හොත් හෝ ගෙනවිත් දුනහොත් එය ඔහුට ලැබුණු බව සලකනු ලැබේ. බාර ගත් ටෙන්ඩර්කරු විසින් ඒ බඩු ගෙන යාමෙන් පසුව ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම සඳහා මුළු තොගය වෙනුවෙන් ඒකාබද්ධ මිළක් සඳහන් කළ යුතුය. වැඩිම මිළ ඉල්ලුම් කරුට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පහත අත්සන කරන අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම්පස ඉහළ කෙළවරේ " හිස් ගෝනි, හිස් බෝතල, ටින් ආදිය සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සඳහා මුද්‍රිත ෆෝර්ම නැත.

4. වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේ අධිකාරි තුමාගේ කාර්‍යාලයේදී 1969 අගෝස්තු මස 7 වෙනි දින උදය 10.35ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටීමට පුළුවන.

5. මේ සඳහා ලබාගත යුතු තවත් විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඊ. ඒ. ඇස්. ඩබ්ලිව්. පෙරේරා,
අධිකාරි, තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහල.

1969 ජූලි මස 5 වෙනි දින,
වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේදීය.

7-1144—69.7.25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුවේ මැනිං වෙළඳ සැලේ ආපන ශාලාව

මැනිං වෙළඳ සැලේ කාර්‍ය මණ්ඩලයට සහ මැනිං වෙළඳ සැලේ සමූපකාර කම්කරු සමිතියේ සාමාජිකයින්ට, 1969 සැප්තැම්බර් මස 1 වන දින සිට 1970 අගෝස්තු මස 31 වන දින දක්වාවූ, අවුරුද්ද තුළ ආහාර පාන සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, 1969 අගෝස්තු 15 වන දින දහවල් 12 දක්වා මා විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ " මැනිං වෙළඳ සැලේ ආපන ශාලා ටෙන්ඩර් " යන්න සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ වෙනත් විස්තර ඇතුළත් කොන්දේසි, කොළඹ 11හේ ඔල්කට් මාවතේ, මැනිං වෙළඳ සැලේ පිහිටි මගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

සහකාර ආහාර පාලක.

1969 ජූලි මස 11 දින,
මැනිං වෙළඳ සැළ,
කොළඹ 11.

7-985—69.7.25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශය | කර්මාන්තයේ නම |
|---|---|
| කොලොන්න කෝරළය ... | 1. කෝන්ගහයට අමුණ |
| | 2. කැම්පනේ වේල්ල |
| | 3. ඔමල්පේ වේල්ල |
| | 4. මහ ඇල |
| | 5. ගිනපිමුල්ල දොල හරහා පයිප්ප දැමීම |
| | 6. මුල් ඇඩියාව වැව ප්‍රතිසංස්කාරණය |
| කඩවත මැද කෝරළය ... | 1. අල ඇල්ල අමුණ |
| | 2. දූරකන්ද අමුණ |
| | 3. දෙනගම අමුණ |
| | 4. ඕලගන්වත්ත අමුණ |
| | 5. ඌරුබොක්ක වැව ඇල සහ පීල්ල |
| | 6. කලවැල්පේ ඇල දියුණු කිරීම |
| | 7. රාමරාව ඇල |
| | 8. උපාසකගෙ අමුණ |
| | 9. දොරවෙල්ඔය අමුණ |
| | 10. දෙබරගල ඇල |
| නවදුන් කෝරළය ... | 1. තිරිවානේ අමුණ වැඩි දියුණු කිරීම |
| | 2. හොරන්ගල් දොල අමුණ වැඩි දියුණු කිරීම |
| | 3. කොහොලාන දොල ව්‍යාපාරයේ පාලකයක් තැනීම |
| | 4. කොහොඹ දොල අමුණට ලැලි සැපයීම |
| | 5. හුණුගලේ වේල්ලේ පැති බැම්ම |
| | 6. පිටවක් දෙනිය පිට වේල්ල |
| | 7. මැලිලියැද්ද අමුණ |
| | 8. නිල්වලා කුඹුරුයායේ අමුණ |
| | 9. උණගලේ වේල්ලේ පැති බැම්ම |
| | 10. වේරගම ගල්අමුණට ලෑලි සැපයීම |
| | 11. පිල්ලෑව වේල්ල |
| | 12. දොඹගස්වින්න පැති බැම්ම |
| අටකලන් කෝරළය ... | 1. උඩහ අමුණ |
| | 2. ගිනපි කුඹුරේ අමුණ |
| | 3. අදුගම මහ අමුණ |
| | 4. උඩවේල්ල අමුණ |
| | 5. යහල ගලගාව දොල පල්ලෙ අමුණ |
| | 6. මරක්කයා අස්සැද්දුම වෙලේ අමුණ |
| | 7. නිත්තවෙල අමුණ |
| | 8. අහස් වෙල අමුණ |
| | 9. යටාගරේ පිටවෙල්යායේ වේල්ල |
| | 10. උඩහ වෙල්යායේ පිට වේල්ල |
| කුකුල් කෝරළය ... | 1. තියඹරගුලනයායේ වාරිමාර්ගය |
| | 2. කන්ද ඔවිටියායේ වේල්ල |
| | 3. මහබෝවිට කුඹුර |
| | 4. දොලේහේන අමුණ සංවර්ධනය |
| | 5. මිහ කුඹුරුයායේ අමුණ |
| | 6. කොහිල ඇල සොරොව්ව තැනීම |
| | 7. හෙලගමගෙ විල කුඹුරට වතුර ගන්නා නාවත |
| | 8. නරසින්ගේ කුඹුර වතුර ගන්නා නාවත |
| | 9. හිමගල කුඹුරුයායේ වාරි මාර්ගය |
| | 10. උරුළුයහම්බිට අමුණ |

| ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | කර්මාන්තයේ නම |
|---|---|
| | 11. උඩබැලිගොඩ වෙල්යායේ අමුණ |
| | 12. ඔව්වියායේ අමුණ |
| | 13. ලෙව්වලයායේ වාරිමාර්ගය |
| | 14. හත්ලාන යායේ ඇල |
| | 15. බෙරවල්කඩ කුඹුරේ අමුණ |
| කුරුවිටි කෝරළය ... | 1. රැහැල්ඔය පැතිබැම්ම |
| | 2. ඇල් අමුණ |
| | 3. මඩුව දෙනිය අමුණ |
| | 4. උඩුමුල්ල යායේ අමුණ |
| | 5. පැලලියැද්ද කුඹුරේ වේල්ල |
| | 6. හල්ගහයට අමුණ |
| | 7. ඇටඹගහ කුඹුරේ අමුණ |
| | 8. ගලහිටිය අමුණ |
| | 9. වෙලමැද ඇල |
| | 10. මඩුව දෙනිය බැම්ම බැඳීම |
| | 11. පෙලන්ගහ දෙනිය බැම්ම බැඳීම |
| | 12. කඳන්ගොඩ පැති බැම්ම |
| | 13. අළුබොක්කේ පිල්ල |
| | 14. ගල්ගොඩේ කුඹුරේ ඇල |
| | 15. ඇලමග වේල්ලේ පැති බැම්ම |
| | 16. අගලකැපූ දෙනිය හෙවත් ගලකැපූ දෙනිය අමුණ |
| | 17. කටුගස් ඇල අමුණේ දකුණු ඉවුර ඇල |
| | 18. මහ වෙල්යායේ ඇල |
| | 19. බංඩාර දොලේ අමුණ |
| | 20. දික්දණ්ඩවල ඇලේ බැම්ම |
| | 21. මහදෙනිය වත්තේ වේල්ල |
| | 22. වත්තක් කුඹුරේ අමුණ |
| | 23. කිකුල්පේ කුඹුර අස්සැද්දුම |
| | 24. උල්දිය අමුණ |
| | 25. එගොඩ පිටිය ගීන් ඇල අමුණ |
| | 26. මහදෙනියායේ මැද ඇලේ බෝක්කුව |
| | 27. මහ වෙල්යායේ බැම්ම |
| | 28. නාරංවැලි ලියැද්දේ පැති බැම්ම |
| | 29. උස්ගෙඩිය කුඹුර අමුණ |
| | 30. කෙටලපත්තල යාය අමුණ |
| | 31. නින්ද කුඹුර අමුණ සහ වේල්ල |
| | 32. නිල දොලේ අමුණ |
| | 33. උඩ කුඹුරේ අමුණ |
| | 34. ඉහල කුඹුරේ අමුණ |
| | 35. ඉහල ඕවිට පිල්ල |
| | 36. හඳුවේ අමුණ |
| | 37. ඉහල කුඹුරේ වේල්ල |
| | 38. හිඟුරාමගේ දෙනිය ඉහල වේල්ල |
| | 39. බෝපැත්ත අමුණට ලැලි සැපයීම. |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 අගෝස්තු මස 6 වැනි දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලව නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර අත්සන් කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවරවල බහා, රත්නපුර දිස්ත්‍රික්යේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර, 1969 අගෝස්තු මස 7 වැනි දින දවල් 12 ට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රිකක්යේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රිකක්යේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසාම ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම්පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අගෝස්තු මස 8 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අමර හේවාමද්දුම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූලි මස 15 දින දිය.

7–1044—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ගාල්ල

**1969-70 පළමුවන භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිලදී ගැනීම පිණිස ටෙන්ඩර්පත් කැඳවීම**

1969-70 වර්ෂයේ පළමුවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ :—

**මාතර දිස්ත්‍රික්කය**—දැරංගල, කලුබෝවිටියාන, රොටුඹ, ඌරුබොක්ක, ඊදඹුකිත, දංගල, දෙනියාය.

**ගාල්ල දිස්ත්‍රික්කය**—බූස්ස, හියාරෙ, පනංගල, බටුවංගල, මණ්ඩල පුර, පිටුවල, හල්විටිගල, දාම්මල, හිනිදුම.

**කලුතර දිස්ත්‍රික්කය**—තිනියාවල.

2. ගාල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයේදී, ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 අගෝස්තු මස 10 වෙනි දින දවල් 12 දක්වා, 1969-70 මුදල් වර්ෂයේ පළමුවන භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

(1) වියන ලද ජෝඩු පොල් අතු (අඩි 7ක් දික්වූද, අඟල් 14ක් පළල්වූද, 1,000 ක මිල).

(2) අලුහුණු බුසල් 1 (එකක්) (රාත්තල් 44 කට නොඅඩු බර තිබිය යුතුයි.)

(3) තම්බාපු හුණු බුසල් 1 (එකක්).

(4) කලුගල් 6′×9′ කියුබ් වලින්.

(5) තලාපු කලුගල් 2″ කියුබ් වලින්.

(6) තලාපු කලුගල් 1½″ කියුබ් වලින්.

(7) තලාපු කලුගල් 1″ කියුබ් වලින්.

(8) තලාපු කලුගල් ¾ කියුබ් වලින්.

(9) තලාපු කලුගල් ½″ කියුබ් වලින්.

(10) පිලිස්සූ ගඩොල් 1,000 (4½″ × 2¾″—8½″)

(11) ගඟවැලි කියුබ් වලින්.

3. ඉහතින් දැක්වෙන ද්‍රව්‍යයන්ගෙන් අංක 4 සිට 9 දක්වා යටතේ දැක්වෙන ද්‍රව්‍යයන් සඳහා පහත දැක්වෙන ක්‍රමයට මිල ගණන් දැක්විය යුතුයි :—

(i) ගල්වළ ළඟදී අට්ටිගසා කියුබ් ගණනින් භාරදීමට :—

(අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.

(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

(ii) ගල්වළ සිට වැඩපලට කොන්ත්‍රාත්කරුගේ වාහනවලින් ප්‍රවාහනය කර වැඩපොළේදී අට්ටිගසා භාරදීමට :—

(අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා ;

(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

4. ඉහතින් දැක්වෙන අංක 1, 2, 3, 10 සහ 11 දැක්වෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් පහත දැක්වෙන පරිදි මිල ගණන් දැක්විය යුතුයි :—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් පෝරණුව/ගොඩදමන ස්ථානය අසලදීම භාරදීම.

(ආ) වැඩ අංශයට ගෙනැවිත් භාරදීමට.

5. පොල් අතු සහ හුණු සැපයීම සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන්, එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 (පණහක්) බැගින්ද, පොල් අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් 50 (පණහක්) බැගින් ද තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැක. සියලුම තැන්පත් මුදල් මගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර, එම රිසිට් පත් ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැක. ටෙන්ඩර්පත් ලබා ගැනීමට හැකි අවසාන දිනය 1969 අගෝස්තු මස 9 වෙනි දින පස්වරු 4 දක්වා පමණක් බව සලකන්න.

6. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. හුණු සහ පොල් අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකටම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ කළ යුතුයි. කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි "ගාල්ල ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සීල්තබා ඉදිරිපත් කළ යුතුයි.

ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි,
ඉඩම් සංවර්ධන කාර්යාලය,
නගර ශාලාව, ගාල්ල.

නැතහොත් ගාල්ල ඉඩම් සංවර්ධන කාර්යාලයෙහි ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියෙහි තැන්පත් කළ හැක.

7. 1969 අගෝස්තු මස 10 වෙනි දින ප. ව. 2. 30 ට ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් එම කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. 1969 අගෝස්තු මස 10 වෙනි දින පස්වරු 12 ට පසු ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයැයි සිතේ නම් ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුළත ද්‍රව්‍ය භාරදීමට හැකිවිය යුතුයි. එසේ කිරීමට නොහැකිවුව හොත් ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත්කරුවෙකු සේ සලකා ඒ අනුව කටයුතු කරනවා ඇත.

9. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාරගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

එච්. පී. ආනන්ද,
ඉඩම් සංවර්ධන නිලධාරි,
ගාල්ල.

1969 ජූලි මස 14 දා,
ගාල්ලේ ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

7–994—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**බතලගොඩ සහ වාරියපොල ගොවිපලවල ලෙලි පොල් විකිණීම**

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, බතලගොඩ ගොවිපලේ ලෙලි පොල් 45,000ක් පමණ සහ වාරියපොල ගොවිපලේ ලෙලිපොල් 28,000 ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1969 අගෝස්තු මස 15 වන දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළත සම්පූර්ණ පොල් තොගය ගොවිපලේ කළමනාකරුට එකවර මුදල් ගෙවා භාරගෙන එකී ගොවිපලෙන් පිටත ගෙනයා යුතුයි.

පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලක වර්ග කිරීමකට ඉඩ නැත. එමෙන්ම කුණු වූ හෝ කුඩා වූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. පේරාදෙණියේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබා ගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල ගොවිපලේ ලෙලිපොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. 1969 අගෝස්තු මස 14 වන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අය විය යුතු යම් මුදලක් වෙතොත් එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "බතලගොඩ/වාරියපොල ගොවිපලේ ලෙලි පොල් මිලට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද; ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද කවරයේ සඳහන්කොට "පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිම වූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හෝ එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, වැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාර දෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමඟ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟියන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර වාරියපොළ/බලතගොඩ ගොවිපළවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපළ).

1969 ජූලි මස 7 වන දින,
පේරාදෙණියේ දීය.

7–962—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මිළ ගණන් කැඳවීම් පත් අංකය: එල් කිව්. 686925

පහත දක්වා ඇති විස්තර අයුරු හයිඩ්‍රොලික් ජැක් සැපයීම සඳහා පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන විසින් 1969 අගෝස්තු 8 පෙරවරු 10.30 තෙක් මිළ ගණන් භාර ගනු ලැබේ.

අංකය : 1. අඩුම වශයෙන් ටොන් දහයක (10) බර ප්‍රමාණයක් එසවිය හැකි හයිඩ්‍රොලික් ජැක් 4 (හතරක් පමණක්).

2. මිළ ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "හයිඩ්‍රොලික් ජැක් සඳහා මිළ ගණන් පත් අංක එල්. කිව්. "686925" යන්න සඳහන් කර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු වෙත මිළ ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිළ දක්විය යුත්තේ.—අංක : 1. දැනට ඇති තොගවලින් (එක්ස් ස්ටොක්) පමණක්, කොළඹ 5, නාරාහේන්පිට, නාවල පාරේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයෙන් කෘෂිකර්ම ඉංජිනේරු තැනට ගෙනවිත් භාරදිය යුතුය.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ මිළ ගනන් භාර ගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සති දෙකක් ඇතුළත එම ද්‍රව්‍ය භාර දීම කළ යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම මිළ කැඳවීමකින් කොටසක් පිළි ගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය,
1969. 7. 17.

7–1074—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

වචන වලින් ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන් වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 අගෝස්තු මස 10 දින දවල් 12 ට පෙර හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 15 ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියලුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතුන් උඩ හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අගෝස්තු මස 10 දින පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියලුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

වැඩි විස්තර හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමාගෙන් ලබා ගත හැක.

ලෙස්ලි ෆ්‍රොන්සේකා ගුණසේකර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම දිස්ත්‍රික්කය.

හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 ජූලි මස 15 දින දීය.

7-1049—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව — මොණරාගල දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනිකුත් සමුපකාර සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

ග. ව. නි. වැල්ලවාය කොටස :

කර්මාන්තයේ නම

1. තණමල්විල කඩක්කරය පිරවීම
2. වැල්ලවාය ඇල වෙනස්කිරීම
3. හම්බෙගමුව අළුත් වැවේ හොරොව්ව දැමීම
4. බෝදාගම වැව අළුත් වැඩියාව
5. තණමල්විල වැව දියුණු කිරීම
6. කතරගම දෙටගමුව වැව දියුණු කිරීම

ග. ව. නි. බුත්තල කොටස :

7. බලේවෙල ඇල දියුණු කිරීම
8. කොටිකම්බොක්ක මැදවෙල අමුණ
9. රන්දෙනිය දකුණු ඇල දියුණු කිරීම

ග. ව. නි. මොණරාගල කොටස :

10. දොඹගහවෙල අමුණ දියුණු කිරීම
11. ලියන්ගොල්ල ගල් ආර අමුණ
12. උඩවෙල අමුණ පිහිල්ල

ග. ව. නි. බඩල්කුඹුර කොටස :

13. ගැඩවිල ඇල දියුණු කිරීම
14. කොටමුදුන ඇල
15. දේවතුර එගොඩවෙල ඇල
16. තලගහගෙදරයායේ ඇල
17. කීනගහකුඹුර ඇල දියුණු කිරීම
18. හිරිමලේ ඇල සහ බෝවෙල ඇල
19. වලස්මුල්ල මැද අරාව අමුණ

ග. ව. නි. මඩුල්ල කොටස :

20. බත්ගොඩ ආර අමුණ
21. පංගුර සෙනසිරි ආර අමුණ
22. කැකුණගස් ආර අමුණ
23. පුංචිආර අමුණ
24. පරගහපිටිය වැව
25. වරාගම අමුණ

ග. ව. නි. මැදගම කොටස :

26. පල්ලේ කුඹුරයාය අමුණ
27. දුරන්වෙල අමුණ
28. මීගහපිටිය අමුණ
29. වරකාලන්ද අමුණ
30. අඹගස්ගන්ගොඩ වැව

ග. ව. නි. දොඹම්ගොල්ල කොටස :

31. උණපඳුර වෙල කණ්ඩිය
32. යකුන්නාව වැව
33. හම්බුනාවේ පිහිල්ල අළුත්වැඩියාව
34. මීගහ ආරාවේ වැව
35. කරනැම්මේ ඇල

ග. ව. නි. බිබිල කොටස :

36. නානායම් ගම් ඇල
37. මහවෙල ඇල
38. ඊතනවත්තේ ඇල දියුණු කිරීම—II කොටස
39. පතිනාවෙල ඇල දියුණු කිරීම—II කොටස
40. කලුතැන්න අමුණ
41. හෙවෙල්වෙල ඇල

ග. ව. නි. මහඔය කොටස :

42. බුලුගස්මුල්ල වැව
43. උඩවැව
44. අස්වැද්දුමේ අමුණ
45. පොල්ලේබැද්ද වැව

මොණරාගල ස. මි. යෝ. ක්‍රි. ගබඩා :

46. වැල්ලවාය ස. මි. යෝ. ක්‍රි. ගබඩාව අළුත්වැඩියාව
47. බිබිල ස. මි. යෝ. ක්‍රි ගබඩාව අළුත්වැඩියාව
48. මොණරාගල ස. මි. යෝ. ක්‍රි. ගබඩාව අළුත්වැඩියාව
49. මොණරාගල රජයේ හාල් මෝල අළුත්වැඩියාව

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "මොණරාගල දිස්ත්‍රික්කයේ .................සුළු වාරි කර්මාන්ත කර්ම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 අගෝස්තු මස 6 දින දවල් 12 ට පෙර මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නො පැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරෙකු සමග හෝ ගිවිසුම කට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අගෝස්තු මස 6 දින ප. ව. 2ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කිය වීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩබ්ලිව්. පී. ඩබ්ලිව්. වීරවර්ධන,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මොණරාගල දිස්ත්‍රික්කය.

මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා
සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූලි මස 14 දින දීය.

7–1050—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මරදාණේ විදුහිසියා ගබඩාවට පහත සඳහන් හොඳ පිරණ තිස් ගෝනි සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1969 අගෝස්තු 8 වැනි සිකුරාදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

බුසල් $2\frac{1}{2}$ (දෙකහමාර) ගෝනි 1,00,000ක් හාල් මැනීම සඳහා.

බුසල් $3\frac{1}{2}$ (තුන්හමාර) ගෝනි 1,00,000 ක් වී මැනීම සඳහා.

2. කොළඹ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරිතැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි.මි.යෝ.ක්‍රි. හා වී.කෙ. අංශයෙන් ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිට පතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ විදුහිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගනකාධිකාරිතැනගෙන් විමසා දැනගත හැක.

වී. නි. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට

1969 ජූලි 18 දින,
කොළඹ 7.

7–1084—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කාක්කපල්ලිය විදුලිබල පේෂ කර්මාන්ත ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 අගෝස්තු 18 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 30,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක :—

1. රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
3. දුම්රිය දෙපාර්තමේන්තුව,
4. අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
5. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉන්ජිනේරු දෙපාර්තමේන්තුව.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1969 අගෝස්තු 16 වැනි දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබා ගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමුව : සීඒ/ඩී/192
1969 ජූලි 15,
කොළඹ 7.

7–1041—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

**කාරෙයිනගර්සි රෙදි ඇපිල්ලීම සඳහා ටෙන්ඩර් කැඳවීම—1969/70**

1969 ඔක්තෝබර් 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා, ඉහත සඳහන් සේවය සඳහා කොළඹ, තැපැල් පෙට්ටිය අංක 593, කොඩිගහ වීදියේ රාජකීය ලංකා නාවික හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969 අගෝස්තු 9 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. අයදුම්කරුගේ මුදල් තරාතිරම ගැන සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පත, ඉහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් ආකෘති 1969 අගෝස්තු 8 දා මධ්‍යාහ්නයේ 12 දක්වා කොළඹ, කොඩිගහ වීදියේ රාජකීය ලංකා නාවික හමුදාවේ සැපයීම් හා ක්‍රම අංශය, ප්‍රධාන මාණ්ඩලික නිලධාරි විසින් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ඉල්ලුම්පතක් ලබා ගැනීමට පෙර ඉහත සඳහන් සේවය සඳහා රු. 75 ක, නැවත ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවිය යුතුයි. චෙක්පත් භාර නොගැනේ. මුදල් ඇණවුම් නාවික හමුදාපති නමින් විය යුතුයි.

4. ටෙන්ඩර් ආකෘති ඉල්ලුම්කරුවන් තම තමන්ගේ නම් සහ ලිපින ඉදිරිපත් කළ යුතුයි. අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුව කිරීමට, ඔවුන්ට ඇති හැකියාව ඔප්පු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

රා. කදිරගාමර්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාපති.

1969 ජූලි 15 වැනි දින,
මූලස්ථානය, රාජකීය ලංකා නාවික හමුදාව,
කොඩිගහ වීදිය, තැ. පෙ. 593, කොළඹ 1.

7–1066—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඇල්. ඩබ්ලිව්/11/5.

## පුත්තලම කච්චේරිය

රු. 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින්, ගම්මිරිස් ගස් වැව ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ අක්කර 124 ක කැලය කැපීම, ගිනිතැබීම හා එළි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1969 අගෝස්තු මස 13 වැනි බදා දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැනගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබාගත හැකි ආකෘති පත් මගින් පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩය සඳහා රු. 20 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1969 අගෝස්තු මස 11 වැනි දින දහවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත් පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූලි මස 16 දින,
පුත්තලම කච්චේරියේ දී.

7–1063—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස්සී 2/17/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ජීවානුහරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ජීවානුහරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ, රජිත වීදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 සැප්තැම්බර් 23 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(ii) විදේශීය ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඔස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේ දී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1969.7.16.

7–1140—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය—රත්මලාන

### අනුරාධපුර ජලසම්පාදන ක්‍රමය, IV පියවර

අනුරාධපුර ජලසම්පාදන ක්‍රමය IV පියවරෙහිම මූලස්ථානයක් හා මූලස්ථානයෙහි පොම්ප කිරීමේ ස්ථාන, සැතපුම් 20 පමණ දිගැති නල සැපයීම හා එලීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර හේමාස් ගොඩනැගිල්ලේ 75 1/1 අංක දරන පළාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1969ක් වූ ඔක්තෝබර් මස 7 වන සිකුරාදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පෙරවරු 10.05ට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ) තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර මඟින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධවූ සියළු විස්තර හා තොරතුරුද ඉහතකී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර, මෙයට අදාළ සැලසුම්ද ඔහුගේ කාර්යාලයේ දී බලාගත හැකි වන්නේ ය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ" කාණ්ඩයේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් හෝ "ඒ" කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්ද පමණක් පහත සඳහන් ලියකියවිලි 1969 සැප්තැම්බර් මස 5 සිකුරාදා දහවල් 12 ට පෙරාතුව ඉහත කී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේ ය :—

(අ) ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි හා

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටද, සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. ඩී. පෙරුමසිනාර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන
වැඩ අංශය, රත්මලාන,
1969.7.16.

7–1061—69.7.25 දන අංක 14,864 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 500යේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අනුරාධපුර රෝහලේ ජල සම්පාදන ක්‍රමය ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 අගෝස්තු මස 25 වන සඳුදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 අගෝස්තු මස 8 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන/පල්දෝරු ක්‍රම/මතුපිට කාණු ක්‍රම/හා/හෝ/ගොඩනැගිලි ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "සී" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණී. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් සියයක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම්වලටද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමූපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමූපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, ගාළු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැත හොත් ලියා පදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකිය. සේවයේ විස්තරද, ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ලිපිනයද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන් ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනු මැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබා ගත නො හැකි බඩුබාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 ජූලි මස 12 වන දා, ,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

7–968—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## මාතර දිස්ත්‍රික්කයේ දොඩම්පහල නැගෙනහිර ග්‍රාම සේවක කොටසේ නිල්වැල්ල ගමේ ධීවර නිවාස 20 ක් තැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ධීවර නිවාස යෝජනා ක්‍රමය යටතේ, දොඩම්පහල නැගෙනහිර ග්‍රාම සේවක කොටසේ නිල්වැල්ල ගමෙහි, "අනුමත සැලැස්ම" ප්‍රකාර ධීවර නිවාස 20ක් තැනීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් මාතර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාර ගනු ලැබේ.

2. 1969.8.7 වැනි බ්‍රහස්පතින්දා සවස 3 දක්වා මාතර දිසාපති ගෙන් ලබාගත හැකි මෙම ටෙන්ඩර් පෝරම, පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහා ඕනෑම කච්චේරියක රු. 50 ක තැන්පත් මුදලක් තබා ඒ සඳහා නිකුත් කරන ලද කුවිතාන්සිය ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පළමුව ඉදිරිපත් කළ යුතුය. ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින්, අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති සඳහා ද තැන්පත් මුදලක් අනවශ්‍යය. ටෙන්ඩර් පෝරම ලබාගෙන, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට නොහැකි වුවන්හට, තැන්පත් මුදල් ආපසු ගෙවනු ලබන්නේ ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය නියමිත වේලාවට පෙර ටෙන්ඩර් පෝරම ආපසු ලැබීමට සැලැස්වුවහොත් පමණී.

3. 1969.8.13 වැනි බදාදා දහවල් 12 ට පෙර මාතර දිසාපති වෙත, ලිපිකවරයේ "නිල්වැල්ල ධීවර නිවාස සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් එවීමට හෝ මාතර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට හෝ පුළුවන. මෙම දිනයට හෝ වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සැලකිල්ලට භාජන නොවනු ඇත.

4. 1969.8.13 වැනි දා සවස 3 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේ දී, සියළුම ටෙන්ඩර්කරුවන්ට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට, ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ල කින් දන්වනු ලැබේ. ටෙන්ඩර් ගිවිසුමේ සඳහන් මුදලින් සියයට

5 ක් සතුටුදායක ලෙස වැඩ නිම කිරීමේ ඇප මුදලක් වශයෙන්, ඔහු විසින් තැන්පත් කළ යුතුය. තෝරාගත් ටෙන්ඩර්කරුට මෙසේ දැනුම් දී දින 10 ක් යාමට පෙර ඔහු විසින් ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ තැන්පත් මුදලවන රු. 50 රාජ සන්තක කරනු ලැබේ.

6. නියම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට 90 ක් වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 ඉහත පස්වන ඡේදයෙහි දක්වා ඇති පරිදි ඇප තැන්පත් මුදලත් සමග, සතුටුදායක අන්දමින් වැඩ නිමකර මාස තුනක් ගෙවී යාමෙන් පසු ගෙවනු ලැබේ.

7. ටෙන්ඩර් එකක් හෝ සියල්ලම, ප්‍රශ්නයක් නොනගාම, ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයෙහි කුමන කොටසක් පිළිගැනීමට හෝ ආණ්ඩුවට බලය තිබේ.

8. වැඩිපුර විස්තර, මාතර කච්චේරියේ සමාජ සේවා අංශයෙන් ලබාගත හැක.

ආර්. ඇල්. ජේ. වික්‍රමරත්න,
මාතර දිස්ත්‍රික්කයේ වැඩ බලන දිසාපති.

1969 ජූලි මස 11 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේ දී ය.

7-967—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා ස්ථා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල සෞඛ්‍ය කාර්යාලවල/සිට කිරි මධ්‍යස්ථානවලට එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100 ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා පුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—මාස්පතා එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුම විසින් නියම කරන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 ජූලි මස 15 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උප ලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) ප්‍රමාණය පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| බද්දේගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරී තැනගේ කාර්යාලයේ සිට බද්දේගම සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | බද්දේගම ... | 10,000 | 69.8.19 පෙ.ව. 10 ට |
| අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අම්බලන්ගොඩ ... | 7,000 | |
| ඇල්පිටිය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ඇල්පිටිය ... | 4,000 | |

7-1042—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

අංක ඇල්.ඩබ්./1/34 (ii)

## පුත්තලම කච්චේරිය

රු. 25,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි පහත සඳහන් අළුත්වැඩියා කිරීම් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1969 අගෝස්තු මස 15 දින සවස 2.30 දක්වා කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

1. ඉහලකටුව-බෝගමුව-පාන්කුලාව පාරේ, හැතපුම් දෙකක් අළුත්වැඩියා කිරීම.

2. ඉහත සඳහන් වැඩය සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබාගත හැකි ආකෘතිපත් මගින් පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩය සඳහා රු. 50 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1969 අගෝස්තු මස 13 වැනි දින දහවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර්පත්, කොළඹ මහා භාණ්ඩාගාරයේ තුන්වැනි මහලේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව තැ. පෙ. 500, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූලි මස 16 දින.
පුත්තලම කච්චේරියේ දී ය.

7–1064—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1969 ඔක්තෝබර් 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුමක් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක ඔහු විසින් හෝ බලය පවරනු ලැබූ ඔහුගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969.7.15 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මාළු | මස් | කරවල | එලවළු | මාළු | මස් | කරවල | එලවළු |
| 1. | නාලන්ද පර්යන්ත ඒකකය ... | 100... | 800 | 1969 අගෝ මස 22වන දින පෙ.ව. 10ට | 250... | 250... | 250... | 250... | 1,000... | 1,050... | 1,000... | 5,000 |
| 2. | බකමූන රෝහල ... | 100... | 800 | | 200... | 200... | 200... | 500... | 1,000... | 1,000... | 1,000... | 4,000 |

7–1070/1—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1969 ඔක්තෝබර් 1 වනද සිට 1970 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍යසේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂ්‍ය වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි..

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙතට'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

1969.7.15 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | | | මස් | මාළු | කරවල | එළවළු | මස් | මාළු | කරවල | එළවළු |
| පල්ලේගම ගෘහ රෝහල | ... 100... | 800 | 1969.8.22 වැනි දින පෙරවරු 10ට | — | ... 500... | 1,000... | 2,000 | — | ... 1,500... | 3,000... | 5,500 |

7–1070/2—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 15 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීථියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ සවභාවය |
|---|---|
| (1) කො/මරදාන ශ්‍රී සංඝරාජ මධ්‍යම මහා විද්‍යාලය | දෙමහල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (2) කො/කොල්ලුපිටිය මහනාම විද්‍යාලය | දෙමහල් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම. |

සංලක්ෂ්‍යය.—කො = කොළඹ දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායඹාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කායඹාලයේ හෝ රු. 100ක මුදලක් තැන්පත් කර, එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 1,13,000, අංක 2 රු. 90,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මැලේ වීථියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරය, බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාර ගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 15 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායඹාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කායඹාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්‍ෂා කර බැලීම සඳහා මෙම කායඹාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66 9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිකිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචිකිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

වී. ජී. බී. මුණසිංහ,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූලි මස 14 වැනිදා,
කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

7–991—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 15 වැනි සිකුරාදා ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාව් නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. මහ/මහනුවර කණිෂ්ඨ කාර්මික විද්‍යාලය | කම්බි වැට හා ගේට්ටු සවිකිරීම 60′×20′ ප්‍රමාණයේ ඈසල් ගොඩනැගිල්ල |
| 2. මහ/දත්තුරේ ම. වි. ... | ගොඩනැගිල්ල |
| 3. මහ/කිරිබත්කුඹුරේ ස්වර්ණජෝති ම. වි. | ගොඩනැගිල්ල |
| 4. මහ/අම්පිටිය බෙරවට්ස් ම. වි. | ක්‍රීඩා භූමිය |
| 5. මහ/කඩුගන්නාව ම. වි. | විද්‍යා රසායනාගාරය |

සංලක්ෂ්‍යය.—මහ = මහනුවර ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 රු. 10,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 2 සිට 3 දක්වා රු. 15,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 4 රු. 25,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 5 රු. 30,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා

ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් විගස ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා ප. ව. 2.30ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරුණු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූලි මස 17 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ය.

7–1085—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ඩීසල් ට්‍රැක්ටර් යන්ත්‍රයක් හා ඊට අයත් උපාංග සැපයීම

ඩීසල් ට්‍රැක්ටර් යන්ත්‍රයක් හා ඊට අයත් උපාංග සැපයීම සඳහා කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1969 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර විවෘත කරන වේලාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන්වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ දී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර, නියමිත ආකෘතිපත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර 1969 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 4.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. ටෙන්ඩරපත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ "ඩීසල් ට්‍රැක්ටර් යන්ත්‍රයක් හා ඊට අයත් උපාංග සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය"යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩරපත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමැති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන්වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.)

6. ටෙන්ඩර ආකෘතිපත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රු. 100ක් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

වී. කන්නන්ගර,
ගණකාධිකාරී, සැපයීම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථාවර ලේකම් වෙනුවට.

1969 ජූලි මස 18 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

7–1109—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ගැලුම් 45/46 ප්‍රමාණයේ පීප්ප විකිණීම

වේරහැර හා සෙසු සියලු ලං.ග.ම. ඩිපෝවල දැනට ඇත්තාවූ ද, ඉදිරියට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුලතදී ලබාගත හැකිවූද ගැලුම් 45/46 ප්‍රමාණයේ හිස් පීප්ප හා සිලින්ඩර තෙල් සහිත පීප්ප මිලයට ගෙන රැගෙන යාම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටි ලං.ග.ම. ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ලබා ගන්නා රිසිට් පත මගේ කායාලය වෙත ඉදිරිපත් කළ විටය. ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනයට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලැබේ.

1969.8.22 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම් අවසාන කරනු ලැබේ.

කාල සීමාවක් අනුව මෙම ටෙන්ඩරය ප්‍රධානය කිරීමට මණ්ඩලය තීරණය කළහොත් පිළිගත් ටෙන්ඩරකරුවන් විසින් මෙම කොන්ත්‍රාත්තුව නිසි අයුරු ඉටුකිරීම සඳහා උපරිම වශයෙන් මුදලින් රු. 5,000 ක ආරක්ෂක මුදලක් තැන්පත් කළ යුතුය. දැනට විකිණීමට තිබෙන පීප්ප වැඩ කරන ඕනෑම දවසක කායාලීය වේලාවලදී පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර මාගේ කායාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාසය,
200, කිරළ පාර, කොළඹ 5.

7–1111—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ 7, තැ. පෙ. අංක 1434, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මිරිස්ස මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 අගෝස්තු මස 25 වන සඳුදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 අගෝස්තු මස 8 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් පනහක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම්වලටද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ප්‍ර. ම. සෞ. ඉංජිනේරු ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තර ද, ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිල දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 ජූලි මස 12 වන දා,
කොළඹ 7,
තැ. පෙ. 143 දී.

7–969—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### චුන්නාකම් ජවපොලෙහි 5බී සහ 3ඒ වර්ගයේ නිවාසයන් තැනීම

රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්ය කර භාරදීම සඳහා 1969 ක්වූ අගෝස්තු මස 28 වන බ්‍රහස්පතින්ද පූ. භා 10 දක්වා කොළඹ පාර්සන්ස් පාරේ රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින රු. 100 මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලිය ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියා පදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් එක්ලක්ෂයකට (රු 1,00,000) නොඅඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝය.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්මවලයි. වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 25 ප. ව. 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 28 වන බ්‍රහස්පතින්ද පූ. භා. 10 ට රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ,
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ජූලි 25 දිනදීය.

7–1071—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## මාතර කච්චේරිය

### මාතර දිස්ත්‍රික්කය තුළ අතපත්තුකන්ද බිම් කට්ටි පාරේ බෝක්කු තැනීම

ඉහත සඳහන් වැඩය සඳහා රුපියල් හැට දාහකට හෝ ඊට වැඩි තැනීම් වැඩ වෙනුවෙන් (රු. 60,000) ප්‍ර. වැ. දෙ., වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් සහ සමුපකාර කම්කරු සමිති, විවිධසේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සීල් තබා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. නොඑසේ නම් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර්පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "අතපත්තුකන්ද පාර බෝක්කු තැනීම සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 1969.8.22 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

5. 1969 අගෝස්තු 13 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම් කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති,

විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර්කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනිත් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

11. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාරගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

පී. ඩබ්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969.7.10 දින,
මාතර කච්චේරිය.

7–993—69.7.25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඉ/3/2/9.

## අම්පාර කච්චේරිය

පහත සඳහන් වැඩ සඳහා රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිව සිටින සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද 1969 අගෝස්තු 6 වන දින පෙ. ව. 11 දක්වා අම්පාර දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය :—

(1) වාවල්ඔඩේ ඇල හා නිව්දවූර් පී අංක 1 කොට්ඨාශයේ ඉඩම් සංවර්ධන ඉඩම් මැදින් යන පාර තැනීම සඳහා පස් හා බොරලු ප්‍රවාහනය කිරීම.

(2) අංක 3 ජනපදයේ 3/70 ඉදිරිපිටින් 3/58 හා 3/59 කුඹුරු ඉඩම්වලට පිවිසෙන පාර තැනීම.

2. දිවයිනේ පිහිටි ඕනෑම කච්චේරියක එක් වැඩක් වෙනුවෙන් රු. 10ක ටෙන්ඩර් තැන්පත් මුදලක් අම්පාර දිසාපති නමින් තැන්පත් කොට ලබාගත් නිල කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර පෝර්ම අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබා ගත හැක. ඉහත අලමුවන ඡේදයේ සඳහන් සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අවශ්‍ය නැත. ටෙන්ඩර පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දින ප. ව. 1 දක්වා ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. පිටපත් දෙකකින් යුක්තව පැහැදිලි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර පෝර්ම දිසාපති, ලේකම් කාර්යාලය, අම්පාර යන ලිපිනයට ලැබෙන සේ ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර පෙට්ටියේ ඒවා තැන්පත් කළ යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ "....................(වැඩයේ නම)......................සඳහා ටෙන්ඩර" යන්න සඳහන් කළ යුතුය. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති හෝ නොපැහැදිලිව ලියා ඇති හෝ ටෙන්ඩර පත්‍ර සලකා බැලීම පිණිස භාර ගනු නොලැබේ.

4. 1969 අගෝස්තු 6 දින පෙ. ව. 11 ට අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේදී ටෙන්ඩර පත්‍ර විවෘත කරනවා ඇත. එසේ ටෙන්ඩර පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගෙන් ලිපියකින් බලයලත් නියෝජිතයකුට ඉඩ දෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු ඒ බව ඔහුට දැනුම් දෙන ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කොට සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම පිණිස අම්පාර දිසාපති සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. ඇපය ජයග්‍රාහක ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මුදලින් සියයට 5ට නොවැඩි මුදලක් වනු ඇත. මෙසේ මෙම ගිවිසුමට ඇතුලත් වීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ නම "වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුලත් කරනවා ඇත. තවද ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදලද ආපසු ගෙවනු නොලැබේ.

6. වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවකු ලෙස රජය පිලිගත් අයෙකු බව හෙලිවීම හෝ තමාට සෑහේ යයි පෙනීයන වෙනත් හේතුවක් හෝ නිසා මෙම සේවාව පැවරීමට එම අවස්ථාවේදී නුසුදුස්සකු යයි අම්පාර දිසාපතිට ඒත්තු යන කවර හෝ පුද්ගලයකු නැතහොත් සමිතියක් සමඟ වුවද මෙකී ගිවිසුමට ඇතුලත් වීම එම දිසාපතිගේ අභිමතය පරිදි ඕනෑම් අවස්ථාවක දී ප්‍රතික්ෂේප කළ හැකිය.

7. ටෙන්ඩර් කාර සමිතිවල ස්ථිරත්වය සහ ක්‍රියාකාරී පැවැත්ම පිළිබඳව ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ, සමුපකාර සංවර්ධන උප කොමසාරිස් හෝ කම්කරු උප කොමසාරිස් යන නිලධාරීන් අතුරින් අදාල නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර පත්‍රයට අමුණා එවිය යුතුය. එකී සමිතිය මෙම කොන්ත්‍රාත්තුව පැවරීමට සුදුසු එකක්ද යන බවට එම නිලධාරියාගේ නිර්දේශය ද එම සහතිකයට ඇතුලත් විය යුතුය.

8. යම්කිසි ටෙන්ඩරයක් මුළුමනින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ නැතහොත් පිළිගැනීමේ සම්පූර්ණ අයිතිය අම්පාර දිසාපති සතුව පවතී.

9. ටෙන්ඩර පෝර්ම ලබාගත් නමුත් ඒවා සම්පූර්ණ කොට අම්පාර දිසාපති වෙත ඉදිරිපත් නොකළ අයගේ සහ නියමිත කොන්දේසිවලට පටහැනිව ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කිරීම නිසා නොපිළිගත් ටෙන්ඩර පත්‍ර එවූ අයගේද ටෙන්ඩර තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. මේ පිළිබඳ වැඩි විස්තර සහ කොන්ත්‍රාත්කරු ඇතුළත් විය යුතු ගිවිසුමේ කොන්දේසි පිළිබඳව ද අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සාමාන්‍ය කාර්යාල කටයුතු කරන වේලාවක දී විමසා දැන ගත හැක.

සී. නාරායනසාමි,
අම්පාර දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969ක්වූ ජූලි මස 15 දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දී ය.

7–1075—69.7.25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු මස 25 වෙනිදා ප. ව. 2.30 දක්වා හෝටන්තැන්න රජයේ බීජ අර්තාපල් ගොවිපලට ඩීසල් වතුර පොම්පයක් එහි ගෙන ගොස් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

**විස්තර.**—පැයකට වතුර ගැලොම් 500ක් ඇද දිය හැකි වූ, උරා ඇද ගැන්ම ඇතුළු අඩි 100ක් පමණ උසට වතුර ඇද දිය හැකි ඩීසල් ඇන්ජිමකින් ක්‍රියාත්මක වතුර පොම්පයක් සැපයීම, පොම්පය අතින් ක්‍රියාත්මක කරන එකක් විය යුතු අතර, පොදු සමතල රාමුවක් සවි කළ ඇන්ජිමක් විය යුතුයි. එයට නියමිත උපකරණ පූට් වැල්වය, දිය පෙරන සහිත සම්පූර්ණ එකක් විය යුතුයි.

2. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 1969.8.25 වන දින පස්වරු 1 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මේ ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් පත වෙනුවෙන් රු. 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. මේ තැන්පත් කිරීම් ඕනෑම කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ අංක 37 දරණ කෘ. අ. ගේ ගිණුමට හෝ කළ යුතුය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට රජයේ කාර්යාලවල භාවිතා කරන මුදල් භාර දෙන වවුචරය (පොදු 118 ආකෘතිය) සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය.

3. ටෙන්ඩර් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතිනම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය හැක.

සියලුම ටෙන්ඩර් "ඝීසල් ඇන්ජිමකින් ක්‍රියාත්මක වතුර පොම්පයක් සැපයීම" යනුවෙන් ලිපි කවරයේ වමේ ඉහළ සඳහන් කොට "කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, බණ්ඩාරවෙල" යනුවෙන් අමතා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලිපි කවරයේ පහළ වම් කෙළවරේ සඳහන් කර එවිය යුතුය.

4. 1969 අගෝස්තු මස 25 වෙනි දින ප. ව. 2.30ට සියලුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් එකී වේලාවට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

5. නියමිත ෆෝර්මයේ හෝ එහි අඩංගු විස්තර වලට අනුකූල නොවන කිසිදු ටෙන්ඩරයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කරන ලද මිළ ගණන් සහ ප්‍රමාණයන් පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, වෙනස් කිරීම් වෙතොත් එහි කෙටි අත්සන යොදා සත්‍ය බවට ඒත්තු ගැන්විය යුතුය. ටෙන්ඩර් මිළ ගණන් ඉලක්කමෙන්ද අකුරෙන්ද ලිවිය යුතුය.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් සමග තමන් සැපයීමට බලාපොරොත්තු වන පොම්පය ගැන සියලුම විස්තර දැක්වෙන විස්තර සටහනක් ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට සති හතරක කාලයක් වනතුරු ටෙන්ඩර්කරුවන්ගේ පිළිගැනීම විවෘතව තබා ගත යුතුය.

8. ටෙන්ඩර් භාර ගත් බව දන්වා සති දෙකක් තුළ පිළිගත් ටෙන්ඩර්කරුවා විසින් සැපයීම නොකලහොත් ඔහුගේ ටෙන්ඩර් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමට ඉඩ ඇත.

9. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනී.

10. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වහොත් ඔහුගේ අතට භාර දුන්නා සේ සැලකිය යුතුය.

11. මේ පිළිබඳ තවත් තොරතුරු අවශ්‍ය නම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරී තැනගෙන් ලබා ගත හැක.

පී. වී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂක (කෘ. ආ. හා ගො.),
පේරාදෙනිය.

පේරාදෙනියේ දීය,
1969.7.12.

7–1004—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

මාගම්මන, රජයේ නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවේ ඇති පරණවූ සිමෙන්ති කොට්ටා 755 ක් මිලයට ගැනීම හා ගෙනයාම සඳහා කෑගල්ලේ, ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් 1969 අගෝස්තු මස 16 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සියළුම ටෙන්ඩර්පත්‍ර 1969 අගෝස්තු මස 11 වැනි දින දහවල් 12 දක්වා කෑගල්ලේ, ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් නිකුත් කරන ආකෘතිපත්‍රවල පූරවා පිටපත් දෙකකින් යුතුව එවිය යුතු ය. කෑගල්ලේ කච්චේරියේ රුපියල් 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම එවන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "පරණවූ සිමෙන්ති කොට්ටා 755 ක් මිලයට ගැනීම හා ගෙනයාම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා, මුද්‍රා තබා "ගොවිජන සේවා සහකාර කොමසාරිස්, කෑගල්ල" යන ලිපිනයට එවිය යුතු ය. ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ලේඛනගත තැපැලෙනි. නොඑසේ නම් කෑගල්ලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් කායඹාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

4. 1969 අගෝස්තු මස 17 වැනි දින පස්වරු 2.30 ට කෑගල්ලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් කායඹාලයේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවනට අවශ්‍යයයි හැඟේ නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවට එහි පැමිණ සිටිය හැක.

5. ටෙන්ඩර්පත්‍ර එවීමට අදහස් කර සිටින අයවළුන්හට කායඹාල වේලාවන්හිදී සිමෙන්ති කොට්ටා තොගය මාගම්මන, රජයේ නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවට ගොස් පරීක්ෂාකර බැලිය හැක. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට මත්තෙන් සිමෙන්ති කොට්ටා තොගය පිරික්සා බැලීමට උපදෙස් දෙමි.

6. ටෙන්ඩර්පත්‍රයේ දක්වන මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් සඳහන් කළ යුතු ය. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී යම්කිසි අඩු පාඩුවක් ඇතිව හෝ අකුරෙන් හා ඉලක්කමෙන් දක්වන මුදලෙහි යම් වෙනසක් ඇතිව හෝ එවන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

7. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඒ බව ඔහුට දක්වා දස දිනක් ඇතුළත එහි සඳහන් මුළු මුදලම ගෙවිය යුතු ය. එසේ මුදල් ගෙවා දින දහ හතරක් ඇතුළත සිමෙන්ති කොට්ටා තොගය ඉවත් කර ගත යුතු ය.

8. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හෝ එයට පෙර ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් නොකරන ලද නම් හෝ ටෙන්ඩරයේ මුදල නියමිත කාල සීමාව තුළ නොගෙවන ලද නම් හෝ තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත දිනයේ දී සිමෙන්ති තොගය ඉවත් කර නොගන්නා ලද නම් ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරු බඩු තොගය ගෙනයාම ප්‍රතික්ෂේප කළහොත් හෝ ගෙනයාමට බැරි වුවහොත් හෝ තැන්පත් මුදල රාජසන්තක කරනු හැර කොන්දේසි කඩන කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙහි ඔහුගේ නම ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

10. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාරගැනීමේ අයිතිය කෑගල්ලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සතු ය.

සු. සපුකොටනගේ,
කෑගල්ලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

1969 ජූලි මස 15 දින,
කෑගල්ලේ ගොවිජන සේවා කාර්යාලයේ දී.

7–992—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිනීම

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි බ්‍රිගේඩියර් අහස් යානයක් වෙන්දේසියේ විකිණීමයි

බ්‍රිගේඩියර් අහස් යානයක සුන්බුන්, අමතර කොටස් හා අලුත් අමතර ඇන්ජිමක්ද සමග කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් 1969 අගෝස්තු 10 වැනි දින පෙ. ව. 10.30 ට කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපළ සහ යන්ත්‍රාගාරයේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ විකුණනු ලබන සියලුම කොටස් කොළඹ 5 නාරාහේන්පිට නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපළ හා යන්ත්‍රාගාර පිළිබඳ කෘෂිකර්ම ඉංජිනේරු විමසා, 1969.8.6 වැනි දින සිට 1969.8.9 වැනිදා දක්වා දිනපතා පෙ. ව. 9 සිට ප. ව. 4 තෙක් කාලය තුළ පරීක්ෂාකර බැලිය හැකිවේ.

විකිණීමෙන් පසු වහාම ගැණුම්කරු විසින් එහිදීම සම්පූර්ණ මුදල ගෙවා මිළයට ගත් කොටස් හැකි ඉක්මණින් ඉවත්කර ගැනීම සඳහා විධි විධාන යොදාගත යුතුවේ. ඉන්පසු එම කොටස් යන්ත්‍රාගාර අංගනයෙහි තබනුයේ ගැණුම්කරුගේ වගකීම පිටය.

කිසිම දැනුම්දීමක් නොකර ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියට ඉදිරිපත් නොකිරීමේ අයිතිය රජය සතුවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූලි 16 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදිය.

7–1080—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## ප්‍රසිද්ධ වෙන්දේසිය

පහත සඳහන් ද්‍රව්‍ය 69.8.4 වැනි සඳු දින පෙ. ව. 10 ට කොළඹ, සෙනෙට් ගොඩනැගිල්ලේ පිහිටි අග්‍රාමාත්‍ය කායඝාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් | | 150 | සි |
| පරණ හැන්සාඩ් | " | 1,500 | සි |
| පරණ සඟරා | " | 500 | සි |
| පරණ ගැසට් | " | 50 | සි |

රෙ. බ්‍ර. වීරකෝන්,
අග්‍රාමාත්‍ය ලේකම්.

අග්‍රාමාත්‍ය කාර්යාලය,
සෙනෙට් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1969. 7. 17 දින.

7--1083—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

## අනුරාධපුර බලවේග පෙහෙකම්හලේ වෙන්දේසියක්

1967-68 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති පහත සඳහන් දේ 1969 අගෝස්තු මස 9 වෙනි දින සහ 10 යන දිනවල පෙ. ව්. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969.8.3 වැනි දින එම බඩු ගැනුම්කරුවන්ට මෙහිදී පරීක්ෂා කර බැලීමට පුළුවන.

ජේ. පී. ඒ. පී. ජයසේකර,
කර්මාන්ත සහකාර.

1969 ජූලි 9 වෙනි දින,
අනුරාධපුර බලවේග පෙහෙකම් කාර්යාලයේ දීය.

(1) අමු කේම්බ්‍රික් පලුදු රෙදි තොගයක්.

(2) පික්ස් 62 අමු කේම්බ්‍රික් පලුදු රෙදි තොගයක්.

7–947—69.7.25 දින අංක 14,864 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| ජූනි | ... 69. 6. 6 සිකුරාද | ... 69. 5.30 සිකුරාද දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | ... 69. 6. 6 සිකුරාද දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | ... 69. 6.13 සිකුරාද දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | ... 69. 6.20 සිකුරාද ප.ව. 3.30 |
| ජූලි | ... 69. 7. 4 සිකුරාද | ... 69. 6.27 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | ... 69. 7. 4 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | ... 69. 7.11 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | ... 69. 7.18 සිකුරාද ප.ව. 3.30 |
| අගෝස්තු | ... 69. 8. 1 සිකුරාද | ... 69. 7.25 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | ... 69. 8. 1 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | ... 69. 8. 8 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | ... 69. 8.15 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | ... 69. 8.22 සිකුරාද ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... 69. 9. 5 සිකුරාද | ... 69. 8.29 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | ... 69. 9. 5 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | ... 69. 9.12 සිකුරාද ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | ... 69. 9.19 සිකුරාද ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | ... 69. 9.26 සිකුරාද ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... 69.10. 2 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | ... 69.10. 9 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | ... 69.10.17 සිකුරාද දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | ... 69.10.24 සිකුරාද දවල් 12.00 |
| නොවැම්බර් | ... 69.11. 7 සිකුරාද | ... 69.10.31 සිකුරාද දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | ... 69.11. 6 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | ... 69.11.14 සිකුරාද ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | ... 69.11.21 සිකුරාද ප.ව. 3.30 |
| දෙසැම්බර් | ... 69.12. 5 සිකුරාද | ... 69.11.28 සිකුරාද ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | ... 69.12. 4 බ්‍රහස්පතින්ද ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | ... 69.12.12 සිකුරාද ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | ... 69.12.18 බ්‍රහස්පතින්ද ප.ව. 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.



ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි